# ජීවිතයට නව මඟක්

යේසුස්වහන්සේව පිළිගැනීම යනු කිමෙක්දැයි අවබෝධ කරගැනීම?



ජෝයිස් මේයර්

1 නිව්යෝර්ක් ටයිම්ස්, හොඳම අලෙවි වාර්තා තැබූ කතුවරිය

# ජීවිතයට නව මඟක්

# ජීවිතයට නව මඟක්

ක්‍රිස්තුස්වහන්සේව පිළිගැනීම යනු කුමක්ද?

ජෝයිස් මේයර්

JOYCE MEYER MINISTRIES ®

125, ශාන්ත ජෝසප් වීදිය,ග්‍රෑන්ඩ්පාස්, කොළඹ 14

If you purchase this book without a cover you should be aware that this book may have been stolen property and reported as "unsold and destroyed" to the publisher. In such case neither the author nor the publisher has received any payment for this "stripped book."

Unless otherwise indicated, all Scripture quotations are taken from THE AMPLIFIED BIBLE: Old Testament. Copyright © 1962, 1964 by Zondervan Publishing House (used by permission); THE KING JAMES VERSION; and from THE AMPLIFIED NEW TESTAMENT. Copyright© 1958 by the Lockman Foundation (used by permission).

The author would like to acknowledge that the story used in chapter 3, on pages 11-13 is on original sermon illustration by Dr. Monroe Parker and is used by permission of Gospel Projects Press, P.O. Box 643, Milton, FL 32572: copyright 1977. www.childrensbibleclub.com

Copyright © 2015 by Joyce Meyer Ministries - Asia

All rights reserved. No part of this publication may be reproduced, distributed, or transmitted in any form or by any means, or stored in a database or retrieval system, without the prior written permission of Joyce Meyer Ministries - Asia.

Joyce Meyer Ministries - Asia
Plot No. 512/B, Road No. 30,
Jubilee Hills, Hyderabad - 500 033
Phone: +91-40-2300 6777
Website: www.jmmindia.org

A New Way of Living - *Sinhala*
*Understanding What It Means to Accept Christ*

# පටුන


1. ඔබේ ජීවිතය තුල ගත යුතු ඉතාම වැදගත් තීරණය 01
2. අපි සැම දෙනාම පව් කර තිබේ. 06
3. වෙනස් වීමට වෙලාව උදා වී ඇත. 12
4. ජීවිතයට නව මඟක්. 18
5. සිතීමට නව මඟක්. 27
6. කථා කිරීමට නව මඟක්. 34
7. ඔබ දෙස බැලීමට නව මාර්ගයක්. 39
8. භය වෙනුවට ඇදහිල්ල ඇතුව සිටින්න. 45
9. ප්‍රීතිමත් ජීවිතය 49

මිදීමේ යාච්ඤාව 53

කතෘ පිළිබඳව 55

පරිච්ඡේදය 1

# ඔබේ ජීවිතය තුල ගත යුතු ඉතාම වැදගත් තීරණය

ඔබ ඔබේ ජීවිතය ගැන කලකිරීමට පත් වී සිටිනවාද? එසේ නම් ඔබ තනි වී සිටින්නේ නැත. ඔබ ලෙසම බොහෝ ජනතාවක් මහන්සි වී, වෙහෙසට පත් වී, ජීවිතය තුල තෘප්තියක් නොලබා සිටියි. ඔවුන් බොහෝ බලාපොරොත්තු ඇතිව නොයෙකුත් ආගමික දේවල් තුලින් ප්‍රතිඵල ලබාගන්න උත්සහා කළත් එයින් සිදුවන්නේ ඔවුන් මත තවත් බර එකතු වීමක් පමණයි. නොයෙකුත් ආගම් වලට අනුව කටයුතු කරමින් ඔබගේ හිස් වූ, දුක්බිත ජීවිතයට විසඳුමක් සෙවූ නමුත් ඔබ ඒ තුලින් දෙවියන්වහන්සේව සෙවූ බවක් අදහස් වන්නේ නැත.

ඔබට මිත්‍රයෙක් අවශ්‍ය නම්, ප්‍රේමය ලැබීමට අවශ්‍ය නම්, ඔබේ පව් වලට සමාව අවශ්‍ය නම් සහ ඔබට යහපත් අනාගතයක් අවශ්‍ය නම් ඔබට පිළිතුර වන්නේ, “යේසුස් ක්‍රිස්තුස්වහන්සේ” යි. ඔබට අලුත් ජීවිතයක් ලබාදී ඔබව “අලුත් මැවීමක්” කිරීමට උන්වහන්සේ බලා සිටින සේක.

ඔබ ජීවිතය තුල කලකිරීමට පත් වී සිටිනවා නම්, එය වෙනස් විය යුතුයි. මීට පෙර කරමින් සිටි දේවල්ම ඔබ ඉදිරියටත් කරනවා නම් පෙර තිබූ ජීවිතයම ඉදිරියටත් තිබෙයි. ඔබ තීරණයක් ගත යුතුයි. එය ඔබේ ජීවිතය තුලදී ගැනීමට යන ඉතාම වැදගත් වූ තීරණයයි.

# ජීවිතයට නව මඟක්

ඔබේ රැකියාව පිළිබඳව, ඔබේ පාසැල පිළිබඳව, ඔබ විවාහ වීමට යන පුද්ගලයා පිළිබඳව, ඔබ පදිංචි වීමට යන්නේ කොහේද යන්න පිළිබඳව සහ මුදල් පරිහරණය කිරීම පිළිබඳව ගන්නා වූ තීරණ වලට වඩා මේ තීරණය ඉතා වැදගත් වේ.

මෙම තීරණය "සදාකාලය" හා සම්බන්ධය. සදාකාලය යනු නිමක් නොමැති දෙයකි. ඒ නිසා සදාකාලය ගත කිරීමට යන ස්ථානය ගැන අප දැනගත යුතුයි.

මරණයට පසු ජීවිතයක් තිබේ. මරණයත් සමඟ ඔබේ පැවැත්ම නිම වන්නේ නැත. ඔබ තවත් ස්ථානයකට ගොස් එහි සිටියි. මරණය යනු "කැරකෙන දොරක් තුලින්" යාමකට සමාන බවට කියමනක් තිබේ. එනම් ඔබ එක් ස්ථානයක් අතහැර තවත් ස්ථානයකට යාමයි.

පොළොවේ ජීවත් වන කාලය තුල දෙවියන්වහන්සේ සමඟ සම්බන්ධතාවයක් ඇතුව සිට පසුව උන්වහන්සේ සමඟ සදාකාලය තුල ජීවත් වන්න ඔබ කැමතිද? එසේ නම් ඔබ, ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේව ඔබේ ගැළවුම්කාරයා ලෙස පිළිගත යුතුයි. අපි සියලු දෙනාම පව් කර තිබෙන බැවින් අපට ගැළවුම්කාරයෙක් අවශ්‍යයි. අපේ පව් වලට වන්දි ගෙවන පිණිස දෙවියන්වහන්සේ තම ඒක ජාතක පුත්‍රයාව මේ ලෝකයට එවූ සේක. උන්වහන්සේ අපේ වැරදි වලට වන්දි ගෙවන පිණිස කුරුසපත් වී මළලනු ලැබූ සේක. නමුත් උන්වහන්සේ තුන්වෙනි දින මළවුන්ගෙන් නැගිට දැන් දෙව් පියාණන්ගේ දකුණු පැත්තේ ඉඳගෙන සිටින සේක. සමාදානය, ප්‍රීතිය සහ දෙවියන්වහන්සේ සමඟ නිවැරදි සම්බන්ධතාවය ඇතිවීම සඳහා එකම බලාපොරොත්තුව නම් "යේසුස් ක්‍රිස්තුස්වහන්සේ" යි.

යේසුස්වහන්සේ ස්වාමින්වහන්සේ බවත්, දෙවියන්වහන්සේ උන්වහන්සේව මළවුන්ගෙන් නැගිට වූ බවත් විශ්වාස කිරීම

තුලින් අපේ පව් වලට සමාව ලැබෙන බව බයිබලය තුල අපට පවසා තිබේ.

"කුමක් හෙයින්ද යේසුස්වහන්සේ ස්වාමින්වහන්සේ යැයි නුඹේ මුඛයෙන් ප්‍රකාශ කරන්නෙහි නම්, දෙවියන්වහන්සේ විසින් උන්වහන්සේව මළවුන්ගෙන් නැගිට වූ බව සිතින් අදහන්නෙහි නම්, නුඹ ගළවනු ලබන්නෙහිය." (රෝම 10:9)

මෙලෙස මුලු සිතින්ම පිළිගෙන, විශ්වාස කිරීම ඉතා වැදගත්ය. දෙවියන්වහන්සේ සිටින බව බොහෝ දෙනා විශ්වාස කරන නමුත් ඔවුන් තම ජීවිත උන්වහන්සේට කැප කර නැත.

මනුෂ්‍ය ජීවිතයේ නිර්මාතෘවරයා වන දෙවියන්වහන්සේගේ කැමැත්ත වන්නේ තම කැමැත්තෙන්ම සහ සතුටින් ඔබේ ජීවිතය ඔබ උන්වහන්සේට භාරදෙනවාටයි. උන්වහන්සේ ඔබව මවන ලද්දේ නිදහසේ ජීවත් වීමටයි. ඒ නිසා මෙලෙස කරන්න යැයි කියමින් උන්වහන්සේ ඔබට බලකරන්නේ නැත. නමුත් ඔබ පොළොවේ ජීවත්වන ආකාරය, මරණයට පසු ඔබ "සදාකාලය" ගතකරන්නේ කොහේද කියා තීරණය කරයි.

ඔබේ ජීවිතය ඔබ යහපත්ව ගතකර තිබෙනවාද? එසේ නැතිනම් ඔබව මවා ඔබ ගැන ඔබටත් වඩා බොහෝ දේවල් දන්නා වූ තැනැන්වහන්සේට ඔබේ ජීවිතය භාර නොදෙන්නේ ඇයි?

මෝටර් රථයක් මිලදී ගත් පසු එහි කාර්මික දෝෂයක් ඇති වුවහොත් එය අලුත් වැඩියා කරන පිණිස රැගෙන යන්නේ රථය නිපද වූ අය වෙතය. මනුෂ්‍යයා ගැනත් එලෙසමය. දෙවියන්වහන්සේ ඔබව මවා ඔබට ප්‍රේම කරන සේක. ඔබේ ජීවිතය කලකිරීමට පත් වී, තෘප්තිමත් නොවී සිටී නම් දෙවියන්වහන්සේ විසින් එය යහපත් කරන පිණිස, එතුමා වෙත ගෙන ගිය යුතුය.

# ජීවිතයට නව මඟක්

මා විසින් මීට පෙර පැවසූ ලෙසම ඔබ විසින් තීරණයක් නොගත හොත් ජීවිතය යහපත වන්නේ නැත. ඔබ කිතුණුවෙක් වීමට කැමතිද? ඔබේ පාපය පමණක් නොව ජීවිතයත් දෙවියන්වහන්සේට භාරදීමට ඔබ කැමතිද? පාපිෂ්ඨ මාර්ග වලින් හැරී, දෙවියන්වහන්සේ සමඟ උන්වහන්සේ වෙනුවෙන් ජීවත් වන අලුත් ජීවිතයක් ගත කරන ආකාරය ගැන ඉගෙන ගැනීමට ඔබ සූදානම්ද? එසේ නම් ඔබ මේ පොත ඉදිරියටම කියවන්න.

ඔබට සිතාගැනීමට නොහැකි තරම් වටිනා ජීවිතයක් ඔබ ඉදිරියේ තිබේ. එය ඔබ සියලු දෙනාහටම ලබාගැනීමට හැක. කාහටවත් එය නොලැබී යන්නේ නැත. ඔබේ අනාගතය පිළිබඳව දෙවියන්වහන්සේ මෙලෙස පවසයි,

> "මා විසින් නුඹලා ගැන කරන යෝජනා මමම දනිමි, නුඹලාට මතු කාලයේදී බලාපොරොත්තුවක් දීමට ඒවා විපත්තියේ නොව සමාදානයේ යෝජනාය."
>
> (යෙරමියා 29:11)

ඔබ වෙනුවෙන් තීරණ ගැනීමට වෙන කිසිවෙකුට නොහැක. එය කළ හැක්කේ ඔබට පමණි.

"අප මේ ලෝකයට කිසිවක් ගෙනාවේ නැත. එයින් අපට කිසිවක් ගෙන යන්ටත් බැරිය." (1 තිමෝති 6:7)

දෙවියන්වහන්සේ "අල්ෆා සහ ඔමේගා" ලෙස දේව වචනය තුල පවසයි. එනම් පටන් ගැන්ම සහ අවසානය දෙවියන්වහන්සේ බවයි. පටන් ගැන්මේදී දෙවියන්වහන්සේ සිටි අතර අවසානයේදීත් උන්වහන්සේ සිටින්නට යන සේක. අවසානයේදී සෑම පුද්ගලයෙක්ම දෙවියන්වහන්සේ ඉදිරියේ සිටිමින් තමන්ගේ ජීවිතය

ගැන ගණන් දිය යුතුයි. ඒ සඳහා සූදානම් විය යුතු කාලය දැන් එළැඹී ඇත. (රෝම 14:12) අප සූදානම් වුවත් නැතත් යේසුස්වහන්සේ පැමිණෙන සේක කියා මා නිතරම පවසනවා.

ඔබ දැන් සූදානම් වී නිවැරදි තීරණය ගත යුතුය. තවත් කාලය වැය කිරීම තුලින් ඔබ ප්‍රමාද විය හැකියි.

පරිච්ඡේදය 2

# අපි සැම දෙනාම පව් කර තිබේ

පාපය යනු දෙවියන්වහන්සේගේ කැමැත්තට අකීකරු වීමයි. පොළොව මත සිටින සියලු දෙනාම පව්කාරයෝය. (රෝම 3:23, දේශනාකාරයා 7:20)

> "සියල්ලෝම පව්කොට, දෙවියන්වහන්සේගේ මහිමයෙන් හීනව සිටිති. එබැවින් ඔවුහු උන්වහන්සේගේ අනුග්‍රහයෙන් ක්‍රිස්තුස්වහන්සේ තුළ තිබෙන මිදීම කරණකොටගෙන, නොමිලයේ ධර්මිෂ්ඨ කරනු ලබන්නෝ වෙති."
>
> රෝම 3:23-24

යේසුස්වහන්සේ ඔබේ පාපය වෙනුවෙන් මිලය ගෙවා ඇති බැවින් ඔබ කළ යුත්තේ විශ්වාස කර එය ලබා ගැනීම පමණි. ඔබේ පව් පිළිගෙන ඒ ගැන පසුතැවිලි වී පාපවලින් සම්පූර්ණයෙන් ඉවත් වීමට කැමති වුවහොත් දෙවියන්වහන්සේ ඔබට සමාව දී අලුත් පුද්ගලයෙක් කරයි.

> "අපේ පාපවල් අපි කියාදෙමු නම්, අපේ පව් අපට කමා කරන්ටත් සියලු අධර්මිෂ්ඨකමින් අප පවිත්‍ර කරන්ටත් උන්වහන්සේ විශ්වාසව ධර්මිෂ්ඨව සිටින සේක."
>
> 1 යොහාන් 1:9

දෙවියන්වහන්සේ යමක් කරයි කියා ඔබ බලා සිටිය යුතු නැත. ඒ උන්වහන්සේ අපේ පාපය වෙනුවෙන් මැරෙන පිණිස තම එකම පුත්‍රයාව දුන් බැවිනි. අපගේ අයුතුකම් වලට වන්දි ගෙවිය හැක්කේ සම්පූර්ණ පාපයක් නැති පූජාවක් පිරිනැමීමෙන් පමණි. දෙවිදුන් අප වෙනුවෙන් යුක්තිය ඉෂ්ඨ කර තිබේ. එබැවින් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි විශ්වාස කරමින් උන්වහන්සේ සමඟින් සමීප සම්බන්ධතාවයක් ඇති කරගැනීම තුලින් අපට නිදහස් විය හැක.

අපට කෙළින්ම දෙවියන්වහන්සේ වෙතට යා නොහැක. ඒ සඳහා මැදිහත්කාරයෙක් අවශ්‍යයි. එනම් අපට අතරමැදියෙක් උවමනා වේ. ඒ පුද්ගලයා නම් ‘‘යේසුස් ක්‍රිස්තුස්වහන්සේ’’ යි. අපි සහ දෙවියන්වහන්සේ අතර තිබෙන හිස්තැන තුල යේසුස්වහන්සේ සිටගත් සේක. මේ හිස්තැන මවන ලද්දේ පාපයයි. මේ හේතුව නිසා යේසුස්වහන්සේ විසින් අපව දෙවියන්වහන්සේ වෙතට ගෙන යන සේක.

පියෙකුගේ ලේ තම දරුවා තුලත් තිබෙන ලෙස දෙවියන්වහන්සේ, යේසුස්වහන්සේ තුල සිටිමින් ලෝකය හා දෙවියන්වහන්සේ නැවත සමඟි කළ සේක. එසේ දෙවියන් වහන්සේ, යේසුස්වහන්සේ කරණකොටගෙන, ලෝකයාව තමන් වෙතට සමඟි කළ සේක. දෙවියන්වහන්සේ තමන් මැවූ ජනතාවට ප්‍රේම කරන සේක. ඒ නිසා පාපයේ වහල්කමට විකුණන්නේ නැතිව එයින් නිදහස්වීම සඳහා එතුමා මාර්ගයක් සෑදූ සේක. එම මාර්ගය නම් ‘‘යේසුස් වහන්සේ’’ යි.

## පාපය තුලින් ශාපය ගෙනයනු ලබයි.

අපේ පාපය අපි පිටම පැමිණෙන බව දෙවියන්වහන්සේගේ වචනය පවසයි. (ගණන් කථාව 32:23) පාපය විසින් ශාපය

ගෙනෙනු ලබයි. කීකරුකම තුලින් ආශිර්වාදය ගෙන එයි. (ද්වීතිය කථාව 28)

සමහර පව්කාරයන් අනෙක් අය ලෙසම යහපත්ව ජීවත්වන බවක් පෙනෙන්නට තිබේ. නමුත්, අවසානයේ ඔවුන්ගේ එම ක්‍රියාවන් වලට ප්‍රතිඵල ලැබෙයි.

දෙවිදුන් කෙරෙහි කීකරු වී යහපත් ජීවිතය තෝරා නොගෙන පාපිෂ්ඨ ජීවිතයක් තෝරාගන්නා විට අපේ ප්‍රාණය තුල අයහපත්කම, අසාර්ථකත්වය අත්දැකිය හැකියි.

මනුෂ්‍යයා යනු මාංශවලින්, ඇටකටුවලින් සමන්විත ශරීරයකින් සහ ආත්මයකින් යුතු කෙනෙකි. තවද ඔහු මනසකින් සහ හැඟීම් වලින් යුතු ප්‍රාණයකි. එය මිනිසාගේ පුද්ගලිකත්වයයි.

පව්කාරයන් වේදනාවෙන් යුතුව තමන්ගේ මනසින් දුක්විඳියි. ඔවුන් කුමක් කළත්, කුමන දේ අයිති වුවත් ඔවුන්ව තෘප්තිමත් කරන දෙයක් නැත. හැඟීම් තුල ඔවුන් දුක්විඳිති. තමන් විසින්ම ජීවිතය පාලනය කිරීමට ඔවුන් තෝරාගත් නිසා තමාට අවශ්‍ය ලෙස කාරණා සිදු නොවන විට ඔවුන් දුකට පත්වන්නටත්, තරහාවීමටත්, කලකිරීමටත් පත්වේ. ඇදහිල්ලේ මාර්ගය ගැන ඔවුන් නොදනීයි. දෙවිදුන් කෙරෙහි විශ්වාස කිරීමට, එතුමාගේ බලය ගැන වටහා ගැනීමට ඔවුනට කවදාවත් නොහැක. ඔවුනට දෙවිදුන්ගේ විශ්‍රාම ස්ථානයටද ඇතුලුවීමට නොහැක.

දෙවියන්වහන්සේගේ විශ්‍රාම ස්ථානයට ඇතුලුවිය හැක්කේ උන්වහන්සේව විශ්වාස කිරීමෙන් පමණි. (හෙබ්‍රෙව් 4:3)

පාපවලින් යුතු ජීවිතය ශාපයෙන් පිරුණු ජීවිතයකි. එයින් කිසි යහපතක් පැමිණෙන්නේ නැත. දෙවිදුන්ගෙන් ඈත් වී ජීවත් වන්නට උත්සාහ කරන අයගේ අවසාන ප්‍රතිඵලය ගැන දෙවියන්වහන්සේ මෙලෙස පවසයි.

## අපි සැම දෙනාම පව් කර තිබේ

“ස්වාමින්වහන්සේට විරුද්ධව පව් කළ බැවින් ඒ මනුෂ්‍යයන් අන්ධයන් මෙන් ඇවිදින හැටියට මම ඔවුන් පිට විපත්ති පමුණුවන්නෙමි. ඔවුන්ගේ ලේ ධූලි මෙන්ද ඔවුන්ගේ මාංශය කසළ මෙන්ද වගුරනු ලබන්නේය.

ස්වාමින්වහන්සේගේ උදහස් දවසේදී ඔවුන්ගේ රිදී නිසාවත් ඔවුන්ගේ රන් නිසාවත් ඔවුන්ට ගැළවෙන්ට නුපුළුවන. උන්වහන්සේ දේශයේ වසන සියල්ලන් පිටට අන්තිමයක්, එනම් භයානක අන්තිමයක්, පමුණුවන සේක” (ශෙපනියා 1:17-18)

මෙම ශුද්ධ ලියවිලි පාඨ භය උපදවන නමුත් යේසුස් ක්‍රිස්තුස් කෙරෙහි අවංක ඇදහිලිවන්තයන්ගේ හදවත් තුල එලෙස භයක් ඇතිවීමට අවශ්‍ය නැත. යේසුස්වහන්සේ කෙරෙහි විශ්වාස කරන අදහන පුද්ගලයන් විනිශ්චයට පත්වන්නේ නැත. (යොහාන් 3:18)

## වැරදි කිරීම හා හෘදසාක්ෂිය

තමා ගැනම හදවතේ ඇතිවන දෝෂාරෝපණය හැමවිටම පව්කාරයා සමඟ තිබේ. එය නොසලකා හැරීමට ඔහුට බොහෝ දේ කළ හැකි නමුත් තම හෘදසාක්ෂියෙන් ගැලවී යාමට නොහැකි බවත්, ඔහුගේ ජීවිතය යහපත් නොවන බවත්, යේසුස්වහන්සේ පැවසූ සේක. (යොහාන් 9:41)

පරණ ගිවිසුම සහ අලුත් ගිවිසුම ලෙස බයිබලය කොටස් දෙකකට බෙදා තිබේ. පරණ ගිවිසුම එය නම් කර ඇති ලෙසම “පරණ” ය. යේසුස්වහන්සේ පැමිණ අලුත් ගිවිසුම ඇතිකරන තෙක් ජනතාවගේ පාපය වසන පිණිස දෙවියන්වහන්සේ එය භාවිතා කළ සේක.

# ජීවිතයට නව මඟක්

පරණ ගිවිසුම කාලයේදී පව් වෙනුවෙන් පූජා ඔප්පු කරමින් මනුෂ්‍යයන්ගේ පාප වසන්නට හැකි වූ නමුත් සදහටම එම පාප ඉවත් කිරීමට නොහැකි විය. හෘදසාක්ෂියෙන් නැගෙන දෝෂාරෝපණය දිගටම පැවතිනි. කෙසේ වෙතත් අලුත් ගිවිසුම තුල අපට සම්පූර්ණ සහ අන්තිම පූජාවක් තිබේ. එය පාපය වසා නොදමා, පාපයත් හෘදසාක්ෂියෙන් නැගෙන දෝෂාරෝපණයත් සම්පූර්ණයෙන්ම ඉවත් කරයි.

පහත සඳහන් ශුද්ධ ලියවිලි පාඨ සෙමින් කියවන්න. එම පාඨවලින් පවසන දේවල් තුල තිබෙන බලය පිළිබඳව කල්පනා කරන්න. එම පද සියල්ල හෙබ්‍රෙව් 10 පරිච්ඡේදයෙන් උපුටාගෙන ඇත.

"යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය එකම වරක් පූජාකිරීම කරණකොට ගෙන අපි පිරිසිදු කරනු ලැබ සිටිමුව." (හෙබ්‍රෙව් 10:10)

"මුන්වහන්සේ සෑම කලටම පව් නිසා එක පූජාවක් ඔප්පු කොට, දෙවියන්වහන්සේගේ දකුණු පැත්තේ හිඳගත් සේක." (හෙබ්‍රෙව් 10:12)

"ඒ දවස්වලට පසුව මා විසින් ඔවුන් සමඟ කරන ගිවිසුම නම්, මාගේ ව්‍යවස්ථා ඔවුන්ගේ සිත්වල තබා, ඒවා ඔවුන්ගේ සිහියේ ලියන්නෙමියි ස්වාමින්වහන්සේ කියන සේකැයි කී පසු,

උන්වහන්සේ කථා කොට, ඔවුන්ගේ පාපවල් සහ අධර්මිෂ්ඨකම් තවත් සිහිනොකරන්නෙමියි කියන සේක." (හෙබ්‍රෙව් 10:16-17)

"නපුරු හෘදසාක්ෂියකින් පිරිසිදු වීම පිණිස අපගේ සිත් ඉසිනු ලැබ, අපේ ශරීරය පිරිසිදු වතුරෙන් සෝදනු ලැබ, සැබෑ වූ සිතක් ඇතුව ඇදහීමේ නිසැකකමින් ළඟාවෙමු. (හෙබ්‍රෙව් 10:22)

# අපි සැම දෙනාම පව් කර තිබේ

මෙම ලියවිලි වලින් බොහෝ වැදගත් සහ අලංකාර කාරණා ගැන තොරතුරු ලබා දෙයි. පළමු කාරණාව නම්, යේසුස් වහන්සේ එකම වරක් පූජා වූ බවත් ඒ වෙනුවෙන් තවත් කිසිවක් එකතු කිරීමට අවශ්‍ය නොවන බවත්ය. පරණ ගිවිසුම කාලයේදී නිතරම පූජාවන් ඔප්පු කළ නමුත් මනුෂ්‍යයන්ගේ හදවතේ දෝෂාරෝපණය ඉවත් වුනේ නැත. සදාකාලයටම පවතින එකම පූජාවක් ලෙස යේසුස්වහන්සේ පූජා වූ සේක. හෘදසාක්ෂියේ දෝෂාරෝපණය සහ පාපය ඒ මගින් ඉවත් කරනු ලැබීය.

හෘදසාක්ෂියෙන් නැගෙන දෝෂාරෝපණයෙන් නිදහස් වී ජීවත් වන ආකාරය ගැන ඉගෙන ගැනීමට තවමත් සමහර අයට අවශ්‍යව ඇති. ක්‍රිස්තුස්වහන්සේ වෙනුවෙන් ජීවත් වන නව ජීවිතයකට ඇත්තටම අවශ්‍ය වන්නේ හැඟීම් පාලනය කරගෙන ජීවත් වීමයි. හැඟීම් වලට තමාව පාලනය කිරීමට ඉඩදීමට නොහැකියි. කුමන ආකාරයේ හැඟීම් ඇතිවුවත් දේව වචනය ඉගෙන ගනිමින් ඊට කීකරු වීමට ඉගෙනගත යුතුයි. කීකරුකම තුලින් සිතාගත නොහැකි තරම් ආශිර්වාද ලැබෙයි.

## පරිච්ඡේදය 3

# වෙනස් වීමට වේලාව උදාවී ඇත

ඔබ දැනටමත් යේසුස්වහන්සේව පිළිගෙන තිබෙනවානම් හෝ දෙවිඳුන් සමඟ මේ ජීවිතය ආරම්භ කිරීමට ඔබ මේ පොත ඉල්ලා තිබෙනවා නම් හෝ නැතිනම් ඔබට මේ පොත ලැබී තිබෙනවා නම් ඔබ දැන් පටන් නව ජීවිතය ආරම්භ කිරීම මගේ ආශාවයි.

යොහාන් 3:16 හි, "...දෙවියන්වහන්සේ ස්වකීය ඒකජාතක පුත්‍රයාණන් දෙන තරම් ලෝකයාට ප්‍රේම කළ සේක. එසේ කළේ, උන්වහන්සේ කෙරෙහි අදහාගන්න සැමදෙනම විනාශ නොවී සදාකාල ජීවනය ලබන පිණිසය..." ලෙස පවසයි.

ඒ පදයේ බලය තේරුම් ගැනීමට උපකාර කරන කථාවක් මම ඔබට පවසන්නම්.

එක් සීතල අඳුරු රාත්‍රියක චිකාගෝ නගරය තුල හිම කුණාටුවක් පටන් ගනිමින් තිබිණි. මනුෂ්‍යයන් සීතලෙන් බේරී; ගෙවල් තුලට වී සිටින අතර කුඩා ළමයෙක් පාර අයිනේ පුවත්පත් විකුණමින් සිටියා. පත්තර විකිණීමට උත්සාහයක් නොදක්වූ මේ ළමයා අධික සීතලේ වෙලී සිටියා. පොලිස් නිලධාරියෙක් ළඟට ගිය ඔහු නිලධාරියාට කථා කොට, "මම නිදියගන්නෙ පාර අයිනෙයි! ඒත් අද හරි සීතලයි. දුප්පත් මට

නිදාගන්න පුලුවන් උණුසුම් තැනක් ඔබ දන්නවාද? කියා ඇසුවා.

පොලිස් නිලධාරියා මේ ළමයා දෙස බලා "ඔබ මෙලෙස කරන්න, අර අතන තිබෙන ලොකු සුදු ගෙදර දොරට තට්ටු කරන්න. කවුරුහරි පැමිණියොත්, යොහාන් 3:16 කියා පවසන්න. එවිට ඔවුන් ඔබව ඇතුලට ගනියි..." කියා පැවසුවා.

මේ කුඩා ළමයා පඩි පෙළ දිගේ ගොස් දොරට තට්ටු කළ විට කාන්තාවක් දොර ළඟට පැමිණියා. එවිට ළමයා "යොහාන් 3:16" කියා පැවසූ අතර ඒ කාන්තාව "ඇතුලට එන්න" කියා ඔහු කැඳවාගෙන ගියා.

ඇය ඔහුව ඇතුලට ගෙන ගොස් ගිනි මැලයක් ළඟ වාඩි කරවා එතැනින් පිටත්ව ගියා. මෙම ළමයා එතැන වාඩි වී "යොහාන් 3:16 මට තේරෙන්නෙ නැහැ. නමුත් ඇත්තටම ඒක සීතලෙන් ඉන්න දුප්පත් ළමයෙකුට උණුසුම දුන්නා" කියා සිතුවා. පසුව කාන්තාව නැවත පැමිණ "ඔබට බඩගිනිද?" කියා ඇසුවා. "මට ටිකක් බඩගිනියි. දින කිහිපයකින්ම මම කෑවෙ නැහැ" කියා ළමයා පැවසුවා.

කාන්තාව මෙම ළමයාව රසකෑම පිරුණු මේසයක් ළඟට ගෙන ගියා. ළමයාත් ඇතිවෙනතුරුම කෑම කෑවා.

ඊළඟට ඔහු, "යොහාන් 3:16 මට ඒක තේරෙන්නෙ නම් නැහැ. ඒත් ඒක බඩගින්නෙ ඉන්න කෙනෙකුට කෑම දුන්නා" කියා සිතුවා.

පසුව කාන්තාව ඔහුව උඩුමහළට ගෙනගොස් උණුවතුරෙන් සේදුවා. එවිට ඔහු "යොහාන් 3:16 මට ඒක තේරෙන්නෙ නම් නැහැ. ඒත් ඒක කිළිටු ළමයෙක්ව පවිත්‍ර කළා" කියා සිතුවා.

පසුව ඇය ළමයාව කාමරයකට රැගෙන ගොස් ඇඳක තබා

පොරෝනයෙන් වසා, ''සුභ රාත්‍රියක්'' කියා පවසා ඔහුව සිප ගත්තා. ඇය විදුලි ආලෝකය නිවූ පසු අඳුරේ සිටිමින් ඔහු ජනේලයෙන් පිටත බලා සිටියා. හිම වැටෙන අයුරු ඔහු දුටුවා.

''යොහාන් 3:16 මට එය තේරෙන්නෙ නැහැ. නමුත් ඇත්තටම එය මහන්සි වූ ළමයෙකුට විවේකය ලබා දුන්නා කියා'' ඔහු සිතුවා.

පසුදින උදෑසන කෑම වලින් පිරුණු මේසයක් ළඟට ළමයාව ගෙන ගිය කාන්තාව කෑම කෑ පසු ගිනිමැලය ළඟට ඔහුව ගෙන ගොස් බයිබලය රැගෙන ඉඳගෙන, ''යොහාන් 3:16 ඔබට තේරෙනවාද කියා ඇසුවා.'' ''නැහැ නෝනා මට තේරෙන්නෙ නැහැ. ඒ ගැන පළමුවෙන්ම මම ඇසුවෙ ඊයේ රාත්‍රියේයි. එලෙස කියන්න කියා පොලිස් නිලධාරියෙක් මට පැවසුවා'' කියා ඔහු කිව්වා.

කාන්තාව විසින් බයිබලය ගෙන යොහාන් 3:16 පෙරලා පැහැදිලි කර දුන් පසු, යේසුස්වහන්සේ ගැන විශ්වාස කරන්නට පටන් ගත් ඔහු, ගිනිමැලය ඉදිරිපිටදී ඔහුගේ හදවත හා ජීවිතය යේසුස්වහන්සේට භාර දුන්නා. ඔහු එතැන ඉඳගෙන, ''යොහාන් 3:16 මට ඒක තේරෙන්නෙ නැහැ ඒත් ඒක අසරණ වූ ළමයෙකුට සුරක්ෂිත හැඟීමක් දුන්නා'' කියා කල්පනා කලා.

දැන් ඔබ ඔබේ පව්වලට ගෙවීම ලෙස පැමිණි දෙවියන්වහන්සේගේ පුත්‍රයා වන යේසුස්වහන්සේව පිළිගෙන ජීවිතය එතුමාට භාර දෙන්න සූදානම් නම් මේ යාච්ඤාව ශබ්ද නගා කියවන්න. එම වචනවල අර්ථය තේරුම් ගන්න.

''දෙවි පියාණෙනි, මම ඔබට ප්‍රේම කරනවා. මගේ පව්වලට සමාව දෙන්න කියා මම ඔබ වෙතට ඇදහිල්ලෙන් අද එනවා. යේසුස්වහන්ස, මම ඔබව විශ්වාස කරනවා. මා වෙනුවෙන් ඔබේ අහිංසක ලේ වැගිරුවා. මට ලැබිය යුතු සෑම දඬුවමක්ම

ඔබ වින්ඳා. ඔබ මරණයට පත්වී, වළලනු ලැබ තුන්වෙනි දින මළවුන්ගෙන් නැගිට්ට බව මම විශ්වාස කරනවා. මරණයට ඔබව අල්ලා ගන්න නොහැකි වුනා. ඔබ සාතන්ව පරාජය කරලා පාතාලයේ සහ මරණයේ යතුරු ඔහුගෙන් ඉවතට ගත්තා. ඔබ මට ප්‍රේම කරන නිසා මේ සියල්ල මා වෙනුවෙන් කල බව මා විශ්වාස කරනවා.

මට කිතුනුවෙක් වෙන්න ඕන. මට ඔබට සේවය කරන්න ඕන. ඔබ මට ලබා දුන් අලුත් ජීවිතය ගත කරන්න ඕන.

මම දැන් ඔබව පිළිගන්නවා. යේසුනි, මම ඔබ හට මාව භාරදෙනවා. ඔබ කැමති ලෙස මාව සාදන්න. යේසුනි, ඔබ මාව ගැළෙව්ව නිසා ස්තුතියි. ඔබේ ශුද්ධාත්මයෙන් පුරවා ඉගෙනගත යුතු දේ මට උගන්වන්න. ගැලවීම ලැබූ බවත්, මා නැවත උත්පාදනය ලැබූ බවත් මරණයට පසු මම ස්වර්ගයට යන බවත් දැන් මම විශ්වාස කරනවා.

දෙවි පියාණෙනි, මම අලුත් ජීවිතයක් ගතකරන්න යනවා. ඔබේ මහිමය සඳහා මම ජීවත්වෙන්න යනවා.”

ඔබ අවංකව මේ යාච්ඤාව කළා නම්, ඔබේ ජීවිතයේ ඉතාම වැදගත් තීරණය ඔබ දැන් අරගෙන තිබේ. ඔබට කොයි ආකාරව හැඟුනත් දෙවියන්වහන්සේ ඔබේ යාච්ඤාව අසා එයට පිළිතුරු දී තිබේ. ඔබට සමාදානය, නිදහස, සහනය සහ ප්‍රීතිය දැනෙයි.

සමහරවිට ඔබට කිසිවක් දැනෙන්නේ නැති වෙයි. ඔබේ හැඟීම්වලට ඔබව පාලනය කිරීමට තවත් ඉඩ නොදෙන්න. දෙවියන්වහන්සේ තම පොරොන්දු ඉෂ්ඨ කරමින් විශ්වාසවන්තව සිටින බැවින් එතුමාගේ වචන විශ්වාස කළ යුතුයි.

උන්වහන්සේ, “පියාණන්වහන්සේ මට දෙන සියල්ලෝම මා වෙතට එන්නෝය. මා ළඟට එන තැනැත්තා මා විසින් කිසිසේත්

අහක දමන්නේ නැත'' කියා පැවසූ සේක. (යොහාන් 6:37)

ඔබ සමඟ ලෝකයේ අවසානය දක්වා සිටීමට දෙවියන් වහන්සේ ඔබට පොරොන්දු වී සිටියි. හැමවිටම ඔබට උන්වහන්සේව දනෙන්නේ නැති වුවත් උන්වහන්සේ හැමවිටම හැමතැනම සිටින සේක. දෙවියන්වහන්සේ තමාගේ ඇස් ඔබ මතම තබා සැලකිල්ලෙන් ඔබව රැක බලා ගන්න සේක. ඔබ හා සම්බන්ධ සියලු දේ ගැන එතුමා සැලකිලිමත්ව සිටින අතර ඒවා සම්පූර්ණ කිරීමට එතුමා පොරොන්දු වී සිටියි. (ගීතාවලිය 138:8, උත්පත්ති 28:15)

''නුඹලා තුල යහපත් වැඩක් පටන්ගත් උන්වහන්සේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ දවස දක්වා ඒක සම්පූර්ණ කරන සේක.'' (පිලිප්පි1:6)

ඔබට අලුත් කල්‍යාණ මිත්‍රයෙක් සිටීම ගැන මා ඔබට සුභ පතනවා. එනම් යේසුස්වහන්සේ! ඔබට සිටිය හැකි හොඳම මිතුරා වන්නේ උන්වහන්සේයි. උන්වහන්සේට ඔබව තේරුම් ගන්න හැකි බැවින් එතුමා සමඟ ඕන දෙයක් කථා කරන්න ඔබට පුළුවන් වේ.

(හෙබ්‍රෙව් 4:15) උන්වහන්සේ කවදාවත් ඔබව ප්‍රතික්ෂේප කරන්නේවත්, වරදට පත්කරන්නේවත් නැත. පමණට වඩා විශාල දෙයක්වත් පමණට වඩා කුඩා දෙයක්වත් උන්වහන්සේ තුල නැත.

ඔබේ සෑම මාර්ගයක් තුලදීම දෙවියන්වහන්සේව තේරුම් ගැනීමත් ඔබේ ජීවිතයේ සෑම අංගයක් තුලටම එතුමාට ආරාධනා කිරීමත් ගැන උන්වහන්සේ කැමතියි.

ඔබ අලුත් මැවීමක් වී තිබේ. පරණ දේ පහව ගොස් සියල්ල අලුත් වී තිබේ. (2 කොරොන්ති 5:17)

# වෙනස් වීමට වෙලාව උදාවී ඇත

ඔබට නව ආරම්භයක් ලැබී තිබේ. ඔබ අතින් වැරදි සිදු වෙයි. අප හැමෝම තුලින්ම එලෙස සිදුවෙයි. ඉගෙන ගැනීමට බොහෝ කාරණා තිබේ. එයට ජීවිත කාලයම යයි. දෙවියන්වහන්සේගෙන් සමාව සහ පවිත්‍ර කිරීම ලැබෙන බව මතක තබා ගනිමින් ඔබ අතින් වරදක් වූ විගස ඉක්මනින් පශ්චත්තාප වන්න.

තවද, කවදාවත් දෙවියන්වහන්සේගෙන් කිසිවක් හංගන්න එපා. උන්වහන්සේ අප ගැන සියලු දේ දන්න සේක. එතුමා ඔබ වෙනුවෙන් බොහෝ දේ කරන සේක. ඔබ නරක ලෙස හැසිරෙන විට අඩුවෙනුත් යහපත්ව හැසිරෙන විට වැඩියෙනුත් ප්‍රේම නොකරන දෙවියන්වහන්සේ හැමවිටම ඔබට එක ලෙස ප්‍රේම කරන සේක. ජීවත් වීමට අලුත් මාර්ගයක් ගැන උගන්වන්නට කාලය දැන් එළඹී ඇත.

පරිච්ඡේදය 4

# ජීවිතයට නව මඟක්

ඔබ දෙවියන්වහන්සේ සමඟ ජීවත් වීමට, අලුත් ජීවිතයකට ඇතුල්වන විට දෙවිදුන්ගේ ප්‍රතිපත්ති ලෝකයේ ජීවිතයට වඩා මුලුමනින්ම අනිත් පැත්තට හැරී තිබෙන බවක් ඔබට හැඟෙයි. සත්‍යතාවනම් අනිත්පැත්ත හැරී තිබෙන්නේ ලෝකයයි. නිවැරදි පැත්ත හැරී තිබෙන්නේ දෙවියන්වහන්සේගේ රාජ්‍ය පමණයි. දෙවියන්වහන්සේගේ මාර්ගය අනුව කාරණා කිරීමට අපි පුරුදු වී නැති බැවින් මුලදී එය අමාරු ලෙස දැනෙන්නත්, තේරුම් ගැනීමට අපහසු වීමටත් හැකියි.

## වතුර බෞතීස්මය

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුල නව ඇදහිලිවන්තයෙක් ලෙස, ඔබ කළ යුතු මුල් කාරණාවලින් එකක් වනුයේ "වතුර බෞතීස්මය" ගැනීමයි.

වතුර බෞතීස්මය යනු ඔබ ක්‍රිස්තුස්වහන්සේව අනුගමනය කිරීමට අභ්‍යන්තරයෙන් ගත් තීරණයේ බාහිර ලකුණයි. යමෙක් වතුර බෞතීස්මය සඳහා ජලය යටට ගිය විට ලකුණක් ලෙස එයින් පෙන්වන්නේ පරණ ජීවිතය වැළලීමකි. ජලයෙන් උඩට එන විට ලකුණක් ලෙස පෙන්වන්නේ නව ජීවිතයක් උදෙසා

මරණින් නැගිට්ට බවයි. බෞතීස්මය යනු දෙවියන්වහන්සේට කීකරුව අප විසින් කරන දෙයකි.

"බෞතීස්මයේ වතුරෙන් එනම් මාංසයේ කිලිටුකම පහකිරීමෙන් නොව, යහපත් හෘදසාක්ෂියකින් දෙවියන්වහන්සේ සෙවීමෙන් දැන් නුඹලාත් යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මළවුන්ගෙන් නැගිටීම කරණකොට ගෙන ගැළවෙන්නහුය" (1 පේතෘස් 3:21)

"නුඹලා සියල්ලෝම පසුතැවිලිව, පව්කමාව පිණිස යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් බව්තීස්මය ලබන්න. එවිට ශුද්ධාත්ම දීමනාව නුඹලා ලබන්නහුය." (ක්‍රියා 2:38)

## සභාවට යෑම

මා විසින් ඉහළින්ම නිර්දේශ කරන තවත් කාරණාවක් නම් ළඟම ඇති "සභාවක්" හා එකතු වීමයි. ගරාජයක් තුළ සිටීමෙන් ඔබ මෝටර් රථයක් බවට පත්වන්නේ නැති ලෙසම සභාවකට යෑමෙන් පමණක් යමෙක් කිතුණුවෙක් වන්නේද නැත. නමුත් අප කිතුණුවෙක් නම් දෙවියන්වහන්සේට නමස්කාර කරන්ටත්, අනෙක් ඇදහිලිවන්තයන් සමඟ සහභාගීකම් පවත්වන්ටත් අපට ඕනෑකමක් තිබිය යුතුයි.

සභාව තුළදී අපි දේව වචනය ඉගෙනගත යුතුයි. සෑම සභාවක්ම හොඳ සභාවක් නොවන අතර ඒවායින් සමහරක් පිටතින් හොඳට පෙනෙන ඇතුලතින් කිසිවෙකුට යහපතක් නොකරන ගොඩනැගිලි පමණයි. ඔබව දේව වචනයෙන් පෝෂණය නොකරන සහ දෙවිඳුන් සමඟ ආත්මික ජීවිතය වර්ධනය කරගැනීමට අභියෝග නොකරන සභාවකට ඔබ යනවානම් යහපත් වූ සභාවක් සොයන්න. හැම වෛද්‍යවරයෙක්ම යහපත් නැති ලෙස හැම සභාවක්ම යහපත් නැත. හැම සභාවක්ම නරකත් නැත. ඔබට සරිලන සභාවක් ඔබ සොයාගත යුතුයි.

සමහර අය විශාල සභාවන්ට කැමති අතර සමහරු කුඩා සභාවන්ට කැමතියි. සමහරු නිකායන්ට අයිති සභාවන්ට කැමති අතර සමහරු නිකායන්ට අයිති නැති සභාවන්ට කැමතියි.

ඔබට ස්ථිර වූ කැපවීමක් තිබෙනවානම් ඔබ සමඟ එකඟ වූ සිතක් තිබෙන අය සමඟ මිත්‍රව සිටිනවානම් ලෞකික පරීක්ෂණ වලින් වැලකීමට ඔබට එය උපකාරයක් වෙයි. කිතුණුවෙක් ලෙස වර්ධනය වන ඔබ සභාවකට යෑම ඉතා වැදගත් වේ. අලුත් ඇදහිලිවන්තයන් හට ඉගෙන ගැනීමට බොහෝ කාරණා තිබෙන අතර ඔවුන් ඉගෙනගෙන ඉදිරියට යන්නේ නැතිනම් ඔහු පසුබට වී නැවත තමාගේ පරණ මාර්ගයේ යෑමේ අවධානමක් තිබේ.

නව ඇදහිලිවන්තයින් බයිබල් අධ්‍යයනය කිරීමේ කුඩා කණ්ඩායම් තුලට ඇතුලු කිරීම ඉතා වැදගත් වේ. කුඩා කණ්ඩායම් තුලදී සරල ලෙස ඉගෙනගන්නත්, ප්‍රශ්ණ අසන්නත්, යාච්ඤා ලබාගන්නත්, අන් අය වෙනුවෙන් යාච්ඤා කරන්නත් හැකියාව ලැබේ. අප බලාපොරොත්තු වන්නේ ඔබේ සභාව තුල ඔබට හවුල්විය හැකි බයිබල් පංති හෝ කණ්ඩායම් රැස්වීම් තිබෙයි කියායි.

ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය වන සභාව, අප විසින් දෙවියන්වහන්සේ ගැන සොයාගෙන ප්‍රකාශ කිරීමට උපකාර කරන ස්ථානයයි. ඔබ අන් අයගෙන් ඉගෙනගෙන තවත් අයට එය ලබාදිය යුතුයි.

## කැපවීම

කැපවීම ඉතා වැදගත්ය. අපව පාපයට හෙළනු ලැබුයේ එක් වතාවක් පමණක් කළ වරද නොව අප විසින් නිතරම කරනු

ලැබූ වැරදිය. එක්වතාවක් හෝ දෙවතාවක් හරි දේ කිරීම තුලින් අපට නව ජීවිතයකට උපකාර ලැබෙන්නේ නැත. කෙලෙස හැඟුනත් අත්නොහැර නිවැරදි දේ කරමින් සිටිය යුතුය. දිනපතාම එලෙස කළ යුතුය.

දෙවියන්වහන්සේ ඔබට හික්මවීමේ ආත්මයක් දී තිබෙන බැවින් ඒදේ ක්‍රියාත්මක කළ යුතුයි. (2 තිමෝති 1:7)

දෙවියන්වහන්සේ සමඟ කාලය ගතකිරීමට කැපවෙන්න. බයිබලය තේරුම් ගැනීමට උපකාරවන පොත් කියවා දේව වචනය අධ්‍යයනය කරන්න. දේව වචනය උගන්වන කැසට්පට, සංයුක්ත තැටි වලට සවන් දෙන්න. හොඳ ක්‍රිස්තියානි රූපවාහිනී වැඩසටහන් නරඹන්න. යාච්ඤා කිරීමට කාලය ගන්න. දවස පුරාම යාච්ඤා කිරීමට ඉගෙන ගන්න.

ඔබ හා සම්බන්ධ සියලු දේ ගැනම දෙවියන්වහන්සේ සැලකිලිමත් වී සිටින බව මතක තියා ගන්න. යාච්ඤාව යනු දෙවියන්වහන්සේ සමඟ කථා කිරීමයි. කිතුණුවෙක් ලෙස වර්ධනය වන අතර දෙවිදුන් සමඟ කථා කරන්න පමණක් නොව උන්වහන්සේගෙන් අසන්නත් ඔබට ඉගෙන ගත හැකියි. දෙවියන්වහන්සේ සමඟ සම්බන්ධව සිට ප්‍රීතිමත් වීමට එයින් ඔබට එයින් හැකිවෙයි.

කැපවීම හා සම්බන්ධ තවත් වැදගත් අංගයක් වන්නේ "දීම" යි. දෙවියන්වහන්සේ අපට බොහෝ දේ දී තිබෙන බැවින් උන්වහන්සේට සහ පොළොවේ උන්වහන්සේගේ වැඩවලට අපි "දිය" යුතුයි. ඔබට ලැබෙන විට අන් අයට උදව් කල යුතුයි.

එලෙස ඔබේ සභාවට හෝ ඔබට උපකාර වූ විශ්වාසවන්ත දේව සේවයක් උදෙසා ඔබට "දිය" හැකිය. දෙවියන්වහන්සේට අපි දෙන හැමදේම දෙතුන් ගුණයක් කර එතුමා නැවත අපට

ලබා දෙන සේක. අපි වපුරන දේ නෙලන බව දේව වචනය පවසනවා.

ක්‍රිස්තුස්වහන්සේව පිළිගෙන නව මැවීමක් වීමට පෙර “දීම” ගැන අපි සැලකිලිමත් වුයේ නැත. ආත්මාර්ථකාමීව අන් අය විසින් දෙන දේ ලබාගැනීමට අප බලා සිටි අතර දැන් දෙවියන්වහන්සේට ප්‍රේම කරන නිසා අපේ හදවත වෙනස් වී තිබේ.

## ශුද්ධාත්ම බෞතීස්මය

බෞතීස්මය යනු සම්පූර්ණයෙන් ගිල්වීමකි. ගිල්වන ඕනෑම දෙයක සිදුරක් තිබුණොත් එය පිරෙන අතර එලෙස ඔබත් විවෘතව සිටියහොත් ඔබටත් ශුද්ධාත්මයෙන් පිරෙන්නට පුලුවන. යේසුස්වහන්සේව ඔබේ ගැලවුම්කාරයා ලෙස පිළිගත් අවස්ථාවේම ඔබට ශුද්ධාත්මය ලැබේ. නමුත් ඒ අවස්ථාවේදී සමහරවිට ඔබ ඔබේ හදවතේ සෑම කාමරයක්ම විවෘතකර උන්වහන්සේට සම්පූර්ණයෙන්ම ඔබව පුරවන්න, ඔබව සුදානම් කර දෙන්න නැතිව ඇති.

ඔබට ශුද්ධාත්මය තිබෙනවා. ඔබේ සියලුම දේ උන්වහන්සේට භාරදිය යුතුයි. දේව සේවය තුල ඔබව පාවිච්චි කිරීමට දෙවිඳුන්ට අවශ්‍ය නමුත් සාර්ථක හා ප්‍රතිඵලදායක වීමට නම් ඔබට උන්වහන්සේගේ බලය අවශ්‍යයයි. අපේ ජීවිත වලට උපකාරයක් ලෙස දෙවියන්වහන්සේ අපට ප්‍රාතිහාර්යාමත් දීමනා පිරිනමන සේක.

දෙවියන්වහන්සේගේ “දීමනා” විවිධය. හැමදෙනාම ඒවා ලබන නමුත් සමහර දීමනා අනෙක් ඒවාට වඩා කැපී පෙනෙන්නට පුලුවන. මට ඉගැන්වීමේ දීමනාවක් තිබෙන අතර සමහර අයට

සංගීතය, පරිපාලනය සහ උපකාර කිරීමේ දීමනා දී තිබේ.

අපේ අවධානය යොමු විය යුතු දීමනා 09 ක් ගැන 1 කොරින්ති 12:7-10 තුල සඳහන්ව ඇත. මේ දීමනා ලබාගැනීමට අපට ලොකු ආශාවක් තිබිය යුතු බව ද උගන්වා ඇත. එනම්, ප්‍රඥාව, දැනගැනීම, ඇදහිල්ල, සුවකිරීමේ දීමනාව, ආශ්චර්යය කිරීමේ දීමනාව, ධර්ම වාක්‍ය කීම, ආත්ම විමසීම, නානා වර්ග භාෂා, එම භාෂා තේරුම් කිරීමේ දීමනාව යන ඒවායි.

ඔබට මේ දීමනා තේරුම්ගත නොහැකි වුවත් ඒවා පැහැදිලි කරදී එම දීමනා පාවිච්චි කරන ආකාරය ඔබට උගන්වන්න කියා දෙවියන්වහන්සේගෙන් ඉල්ලන්න. බයිබලය තුල බොහෝ අවස්ථාවලදී මනුෂ්‍යයන් විසින් තමා නොදන්න භාෂාවලින් කථාකරන අයුරු අප දැක තිබේ. අන්‍ය භාෂාවෙන් කථා කරනවිට අප දෙවියන්වහන්සේ සමඟ රහස් කථා කරනවා. අන් භාෂා කථා කරන්නා තමාම වර්ධනය කර ගනී. හැමදෙනාම අන්‍ය භාෂාවෙන් කථා කරනවාට තමා කැමති බව ප්‍රේරිත වූ පාවුල්තුමා විසින් පැවසීය. 1 කොරින්ති 14:2, 4-5

බොහෝ කාලයක සිට අන්‍ය භාෂාවේ දීමනාව කිතුණුවන් අතර විශේෂ කාරණාවක් වී තිබේ. මේ දීමනාව අද අපට අවශ්‍ය බව සමහරු විශ්වාස කරන අතර එය අවශ්‍ය නැති බව තවත් සමහරු විශ්වාස කරයි. පුද්ගලිකව මම මේ දීමනාව මගේ ජීවිතය තුල අත් දැක තිබෙන අතර අවුරුදු 30 කට වැඩි කාලයක් මම අන්‍ය භාෂාවෙන් කථා කරමින් මගේ ජීවිතය තුල අත් දැක තිබෙනවා. ඒනිසා, එය අද සිටින කිතුණුවන් හට අදාල වන බව මම හොඳින් දන්නවා.

අපට උපකාර වන ඕනෑම දෙයක් අපට අවශ්‍ය වේ. බොහෝ විට මනුෂ්‍යයන් තමා විසින් අත් නොදුටු හෝ තේරුම් ගැනීමට අපහසු කාරණා ප්‍රතික්ෂේප කරනවා. මේක වැරදි දෙයකි. අපි

බයිබලය කියවා එහි සඳහන් කාරණා විශ්වාස කළ යුතුයි.

ඔබ උන්වහන්සේගේ දීමනා ගැන පමණක් අවධානය යොමු නොකර ශුද්ධාත්මයාණන් කෙරෙහි ඔබේ අවධානය යොමු කළ යුතු බවට මම ඔබට අනතුරු අඟවනවා. සමහරු ප්‍රමාණය ඉක්මවා අන්‍ය භාෂාව හෝ අනෙක් දීමනා ගැන බොහෝ ලෙස සලකනවා. ඔබට සුදුසු දීමනාව වෙලාවට ලැබෙයි.

ඔබේ ජීවිතය දෙවිදුන්ට භාරදී දේව අභිමුඛය තුල වැඩියෙන් කාලය ගතකරන්න. නියම වෙලාවේදී අන්‍ය භාෂාව සහ අවශ්‍ය දීමනා ඔබට ලැබෙයි.

## දෙවියන්වහන්සේගේ ආශිර්වාද ලැබීමට පමණක් නොව දේව අභිමුඛය සෙවීමටත් උනන්දු වන්න.

දෙවියන්වහන්සේ ඔබ වෙනුවෙන් යහපත් දේවල් කිරීමටත්, ඔබට බොහෝ ආශිර්වාද දෙන්ටත් ඕනෑකමින් බලා සිටින සේක. දෙවියන්වහන්සේ ඔබට දෙන දේවල් ලබා ගැනීම පමණක් නොව, උන්වහන්සේ කෙබඳු කෙනෙක්ද කියා සෙවීමත් ඉතා වැදගත් වේ. දෙවියන්වහන්සේව කිසිවෙකුට සමාන කළ නොහැකි තරම් උන්වහන්සේ පුදුමය. දේව අභිමුඛයේ සිටීම පුදුම සහගතය.

ඔබ දෙවියන්වහන්සේගේ මුහුණ සොයන විට, උන්වහන්සේගේ අත ඔබ වෙනුවෙන් දිගුකර තිබෙන බව දකින්න හැකිවෙයි. නමුත් ඔබ දෙවිදුන්ගේ අත (ආශිර්වාදය) පමණක් සොයනවානම් එයින් ඔබ දෙවිදුන්ව නින්දාවට පත් කරයි.

ඔබට උවමනා වන ඕනෑම දෙයක් දෙවියන්වහන්සේගෙන් ඉල්ලන්න. එය ඔබට සුදුසු දෙයක්නම් අවශ්‍ය වෙලාවට දෙවිදුන් එය ඔබට ලබාදෙයි. නමුත් අන් හැමදේටම වඩා ඔබේ ජීවිතයට දෙවියන්වහන්සේ අවශ්‍ය බව මතක තබාගත යුතුයි.

දෙවියන්වහන්සේගේ ස්වභාවය, එතුමාගේ මාර්ගය, ප්‍රඥාව, බලය ගැන තේරුම් ගැනීමට ඥානය වැඩි වැඩියෙන් ඉල්ලන්න.

උන්වහන්සේ සියල්ලෙන් සියල්ලයි. එතුමා නොමැතිව අපට කිසිවක් කළ නොහැක.

"මාගෙන් වෙන්ව කිසිවක් කරන්නට නුඹලාට බැරිය" (යොහාන් 15:5)

"මක්නිසාද සියල්ල උන්වහන්සේ කෙරෙන්ය, උන්වහන්සේ කරණකොටගෙනය, උන්වහන්සේ උදෙසාය. උන්වහන්සේට සදාකල්ම මහිමය වේවා" (රෝම 11:36)

## ඉගෙන ගැනීමට බොහෝ කාරණා තිබේ

මේ කුඩා පොත තුල ඔබ විසින් ඉගෙනගන්නත්, මා විසින් උගන්වන්නත් උවමනා බොහෝ කාරණා තිබේ. ඔබේ ඇදහිල්ල පදනම් කරමින් කිතු දහමේ අත්තිවාරමට අවශ්‍ය ඉගැන්වීම් ඔබ උගත යුතුයි.

බොහෝ සභාවන්වල නවක ඇදහිලිවන්තයින් උදෙසා පන්ති පවත්වයි. ඔබත් එවැන්නකට සහභාගී වන ලෙස මම ඉල්ලා සිටිනවා. යේසුස්වහන්සේ කන්‍යාවක් තුලින් ඉපදුන බව ඔබ ඉගෙන ගනියි. එය එසේ නොවන බවක් ඔබට සිතෙයි. කෙසේ වෙතත් එය සැබෑවකි. එය එලෙස වන්නේ ඇයිදැයි තේරුම් ගැනීම ඉතා වැදගත්ය. දෙවියන්වහන්සේව නොදන්නා අයට දේශනා කරන පිණිස ඔබ එය ඉගෙන ගත යුතුයි.

දෙවියන්වහන්සේ වෙනුවෙන් "දීම" වැදගත් දෙයක් බව ඔබ ඉදිරියට ඉගෙන ගනියි. එලෙසම ත්‍රිත්වය ගැනත් එනම් පියාණන්, පුත්‍රයාණන් සහ ශුද්ධාත්මයාණන් ගැනත් එතුමාට සේවය කිරීම

ගැනත් ඉගෙන ගනියි. දේවදූතයන්ගේ සේවාවන් පිළිබඳව, පශ්චත්තාපය සහ තවත් බොහෝ කරුණු ගැන ඔබ ඉදිරියට ඉගෙන ගනියි.

මේ හැමදේම ඔබ සමඟ බෙදාගැනීමට නොහැකි වුවත් ඔබේ අලුත් ජීවිතය සඳහා මූලිකව වැදගත් වන යම් කරුණු මම ඔබ සමඟ බෙදා ගන්නම්. අපි ඉදිරියටත් කියවමු.

පරිච්ඡේදය 5

# සිතීමට නව මගක්

සම්පූර්ණයෙන්ම, අලුත් විදියකට සිතීමට ඉගෙන ගැනීම ඉතාම වැදගත් වෙයි. ඔබ සහ ඔබේ ජීවිතය වෙනුවෙන් දෙවියන්වහන්සේට යහපත් සැලැස්මක් තිබෙනවා. නමුත් ඔබ ඒ සම්බන්ධව උන්වහන්සේ සමඟ එකඟ විය යුතුයි.

සාතන්ට ඔබේ ජීවිතය පිළිබඳව සැලැස්මක් තිබේ. එය යහපත් එකක් නොවෙයි. හොරා (සාතන්) එන්නේ හොරකම් කරන්නත්, මරන්නත්, විනාශ කරන්නත්ය. (යොහාන් 10:10) අපේ මනසට නොයෙක් ආකාර වැරදි සිතුවිලි යොමුකරන සාතාන් අපි ඒවා විශ්වාස කර ඔහු සමඟ එකඟ වෙයි කියා බලාපොරොත්තු වී සිටියි. ඔහු මනුෂ්‍යයා රවටා ඔවුන්ගේ ජීවිත තුලට ඇතුලු වන්නේ එලෙසයි;

“නුඹලා මේ ලෝකයේ ආකාරයට සමාන නොවී, දෙවියන්වහන්සේගේ කැමැත්ත එනම් යහපත් වූ පිළිගත යුතු වූ සම්පූර්ණ වූ දෙය කුමක්ද කියා දැනගන්නා පිණිස, සිත අලුත් කරගැනීමෙන් අන්‍යාකාර ඇත්තෝ වෙන්න” (රෝම 12:2)

ඉහත පදයෙන් පැහැදිලි වන්නේ, අප සිතන ආකාරය වෙනස් කරගන්නා තෙක් අපේ ජීවිත වෙනස් නොවන බවයි. අලුත් ජීවිතයක් අවශ්‍ය නම් සිතීමේ ආකාරය අලුත් විය යුතුයි. අප

එකිනෙකා වෙනුවෙන් දෙවිඳුන් හට යහපත් සැලැස්මක් තිබේ. නමුත් එය ඉෂ්ඨ වන බව පෙනෙන්නට යන්නේ, අපි නිවැරදි ලෙස සිතීම වැදගත් දෙයක් ලෙස සිතුවොත් පමණි.

## ඔබට ඔබේ සිතුවිලි පාලනය කළ හැකියි

සමහරවිට ඔබත් මා කලින් සිටි ආකාරයටම සිටිනවා ඇති. එනම්, ඔබට කිසිවක් කරන්නට නොහැකියි කියා සිතනවා ඇති. එය වැරදිය. ඔබට කළ හැකි නොහැකි කාරණා තෝරාගැනීමට හැකියි. ඔබ එය ප්‍රවේශමෙන් කළ යුතුයි. "සිත" යන මඟ මනුෂ්‍යයාත් ගමන් කරන බව මතක තබා ගත යුතුයි.

අපි හිතමු අපි කෑමක් ගැන සිතන්න පටන් ගත්තා කියා අයිස්ක්‍රීම්, චොකලට් හෝ කුමක් හෝ රස කෑමක් වෙන්න පුළුවනි. ඒ ගැන වැඩියෙන් සිතන විට එය කෙසේ හෝ ලබාගත යුතුයි ලෙස ඔබට සිතෙයි. ඒ ගැන බොහෝ දුරට සිතුවොත් අපි වාහනයකට නැඟ බොහෝ දුරක් ගමන් කර එය කෑ පසු ඒ සඳහා අපි අපේ කාලය, ශ්‍රමය, මුදල් නාස්ති කල බවක් සිතී කලකිරෙන්න පුළුවනි.

යමෙක් අපව රිද්දවන අදහසින් අපට වරදක් කළ විට අපි ඒ ගැන බොහෝ දුරට සිතුවොත් අප තුල ඔහු ගැන වෛරයක් ඇති වෙයි. අපේ සිතුවිලි තුලින් අපේ හැඟීම්වලට බලපෑමක් ඇති වී අපි ඔහුට බනින්නත් පුළුවනි.

ඔබ කලකිරීමට පත් වී මානසිකව වැටී සිටිනවානම්, කුමක් ගැනද සිතමින් සිටියේ කියා ඔබෙන්ම අහන්න. එවිට ඔබේ සිතුවිලි සහ හැඟීම් අතර සම්බන්ධයක් තිබෙන බව සොයාගනියි.

සාතන් සමඟ අපි යුද්ධ කරන විට යුද්ධ පිටිය වන්නේ අපේ "මනස" යි. වැරදි සිතුවිලි සහ කල්පනාවන් පහත හෙලා දමා

## සිතීමට නව මඟක්

"යේසුස්වහන්සේගේ සිරකරුවෙක්" ලෙස සිටිය යුතු බව 2 කොරින්ති 10:4-5 හි අපට උගන්වයි. එයින් අදහස් කරනුයේ අපි දේව වචනය අනුව සිතිය යුතු බවයි.

ක්‍රිස්තුස්වහන්සේගේ ඉගැන්වීම් වලට එකඟ නොවන සෑම කාරණාවක්ම යක්ෂයාගෙන් පැමිණෙන බොරු දේවල් ලෙස සිතා ඒවා සිතින් ඉවත් කල යුතුයි. සතුරාට ඔබේ මනස පාලනය කිරීමට හැකිනම් ඔහුට ඔබේ ජීවිතයත් පාලනය කළ හැකියි. උදාහරණයක් ලෙස, දිවිනසාගැනීමට ඔබට සිතෙනවානම් එය ඔබේ මනසට ඇතුලු කරන්නේ දෙවියන්වහන්සේ නොවෙයි. දෙවියන්වහන්සේ කැමති ඔබ ජීවත්වනවාටයි. ඔබ වැඩකට නැති පුද්ගලයෙක් බවත්, කිසිවෙක් ඔබට ප්‍රේම නොකරන බවත් සිතුනොත් ඒවා දෙවිදුන්ගෙන් පැමිණෙන දේවල් නොවෙයි. ඒ දේවල් දෙවියන්වහන්සේ සමඟ එකඟ නොවෙයි.

## අශුභවාදී ලෙස සිතීම

ඕනෑම ආකාරයකට ඇතිවන අශුභවාදී සිතුවිලි ගැන ප්‍රවේශම් වන්න. දෙවියන්වහන්සේ ගැන හෝ ඔබේ ජීවිතය වෙනුවෙන් තිබෙන දේව සැලැස්ම ගැන කිසිදු අශුභවාදී ස්වභාවයක් නැත.

භාගයක් වතුර පිරී ඇති වීදුරුවක භාගයක් හිස් වී ඇති බව දකිනවාට වඩා භාගයක් වතුර පිරී ඇති බව දකින එක සුභදායකයි. සුභවාදී වීමෙන් කිසිවෙක් අපහසුතාවයට පත්වන්නේ නැත.

මෙපමණ කාලයක් ඔබේ ජීවිතය කෙලෙස තිබුණත් දැන් ඔබේ අනාගතය වෙනුවෙන් සුභවාදී දර්ශනයක් තිබිය යුතුයි. දෙවියන්වහන්සේ ඔබට යහපත් දේවල් කරන්න යනවා කියා ඔබ විශ්වාස කළ යුතුයි.

# ජීවිතයට නව මඟක්

මමත් මීට පෙර සිටි ලෙසම ඔබත් අසුභවාදී පුද්ගලයෙක් ලෙස සිටිනම් සුභවාදී පුද්ගලයෙක් වීමට යම් පුහුණුවක් අවශ්‍ය වෙයි. මම හැදුනේ ඉතාම අයහපත් පරිසරයකයි. ඒනිසා හැමවිටම මම කරදර සහ ආපදා බලාපොරොත්තු වුනා. නමුත් අසුභවාදී ලෙස සිතීම තුලින් අපට කරදර පැමිණෙන බව මා ඉගෙන ගත්තා.

"දුක්ඛිතයාගේ සියලුම දවස් නරකය. එහෙත් සතුටු සිත නිරන්තර මංගල්‍යයක්ය." (හිතෝපදේශ 15:15)

ශුද්ධාත්මයාණන් පළමු වතාවට මට මේ පදය මහපෙන්වන විට, "කලකිරීම" යනු කුමක්ද කියා මා දන සිටියේ නැත. යම් නරක දෙයක් සිදුවීමට යන බවට ඇතිවන අසුභවාදී සහ භයගෙන දෙන සිතුවිලි "කලකිරීම" ට හේතුවන බව පසුව මා ඉගෙන ගත්තා.

බොහෝ වෙලාවට මා බලාපොරොත්තු වී සිටි දේවල් මට ලැබිණි. එනම් "කරදර" ය. මට මගේ ජීවිතය වෙනස්කර ගැනීමට අවශ්‍යව තිබූ නමුත් දෙවියන්වහන්සේ එය වෙනස් නොකළේ ඇයි කියා තේරුම් ගැනීමට නොහැකිව තිබිණි. අවසානයේ මා හට අවබෝධ වූ දෙය නම්, උන්වහන්සේ මගේ ජීවිතය වෙනස්කිරීමට පෙර මුලින්ම මම, සිතන පතන ආකාරය මා විසින්ම වෙනස් කරගත යුතු බවයි.

ඔබ කිසිම දෙයක් ගැන අසුභවාදීව නොසිතන්න. ඔබේ අනාගතය ගැන හෝ අතීතය ගැනවත් එලෙස නොසිතන්න. ඔබ දෙවිඳුන්ව විශ්වාස කළොත් දෙවියන්වහන්සේ විසින් ඔබේ වර්තමාන ජීවිතය වෙනුවෙන් තබා තිබෙන සැලැස්මට ඔබේ අතීතයත් ඇතුලත් කරයි. මීට පෙර ඔබ අතින් සිදු වූ සෑම වරදක්ම ඔබව හොඳ ඥානයක් තිබෙන කෙනෙක් බවට පත් කරයි. (ඔබ නැවත ඒ වැරදි නොකර සිටියි.)

ඔබේ මුදල් ගැන, මිතුරන් ගැන, පවුල ගැන, ඔබේ පෙනුම ගැන, ඔබට තිබෙන හෝ නොතිබෙන රැකියාව ගැන, ජීවත්වන ස්ථානය ගැන ඔබේ වාහනය ගැන හෝ වෙන කිසිම දෙයක් ගැන අසුභවාදී නොවන්න. සුභවාදී ආකල්ප වර්ධනය කරගන්න. එයින් සුභවාදී සහ බලවත් ජීවිතයක් ඔබට ලැබෙයි.

## කරදර වෙන්න සහ කනස්සලු වෙන්න එපා

කරදරවීම සහ කනස්සලු වීම යනු නරක ලෙස සිතන, කියන ආකාර දෙකකි. කරදර වීමෙන් කිසිදු යහපතක් නොවන අතර එයින් විශාල හානියක් සිදුවිය හැකියි. ඔබේ කරදර, ගැටළු දෙවිදුන් බලාගනියි යැයි ඔබ විශ්වාස කළයුතුයි.

ඔබ කරදර වන විට වයසට වඩා පෙනුමක් ඔබෙන් පෙනෙයි. හිසරදය, බඩේ වේදනාව ඇතිවෙයි. අන් අය සමඟ සුහදව සිටීමට නොහැකි වෙයි. එය දේව කැමැත්තක් නොවෙයි.

මුලදී ඔබට "කරදර නොවී සිටීම" ට ටිකක් අපහසු විය හැකියි. මන්ද දැනට ඔබ පුරුදු වී සිටින්නේ ඔබව බලාගන්න සහ ඊළඟට කුමක්ද කළ යුත්තේ කියා කල්පනා කිරීමටයි. නමුත් දැන් ඔබ ජීවිතය සඳහා අලුත් මඟක් ඉගෙන ගනිමින් සිටින බව මතක තබා ගත යුතුයි.

දෙවියන්වහන්සේ සමඟ සම්බන්ධතාවයක් නොමැති අයට "කරදර විය" යුතු බවක් හැඟෙයි. නමුත් ඔබ එසේ නොවෙයි. දෙවිදුන් ඔබට පක්ෂයි. උන්වහන්සේ පවසන්නේ, ඔබේ කරදර එතුමා පිට තබන්න. කියායි. එවිට උන්වහන්සේ ඔබව බලා ගනියි. (1 පේතෘස් 5:7)

කනස්සලු වීම යනු හෙට ගැන සිතමින් අද කාලය ගත කිරීමයි. යේසුස්වහන්සේ එසේ නොකරන ලෙස පැවසූ සේක.

මන්ද එක් එක් දවසට ඒ ඒ දවසට සෑහෙන කරදර තිබේ. (මතෙව් 6:34)

දෙවිදුන් සමඟ සිටින විට ඒ ඒ අවස්ථාවලදී ඔබ විසින් කළ යුත්තේ කුමක්ද කියා ඔබට තේරුම් යයි. ඒ වෙලාව වන තෙක්ම කළ යුතු දේ කුමක්ද කියා ඔබට අවබෝධ නොවෙයි. දෙවියන්වහන්සේ කැමති වන්නේ ඔබ එතුමා විශ්වාස කර ඉගෙන ගැනීමටයි. උන්වහන්සේ කවදාවත් ප්‍රමාදවන්නේ නැත. නමුත් සාමාන්‍යයෙන් එතුමා වෙලාවට කලින් ක්‍රියා කරන්නේත් නැත. අලුත් ඇදහිලිවන්තයෙකුට නම් “බලාසිටීම” අමාරු දෙයක් වෙයි.

මන්ද ඔබ තවම එයට හුරු වී නොමැති නිසායි. කෙසේ වෙතත් ටික කලකින් ඔබ එයට කැමති වීමට පටන් ගනියි. ඔබේ මනස සැනසිල්ලෙන් තිබෙයි. ඒ නිසා ඊළඟ දවස ගැන කරදර නොවී එදිනෙදා ජීවත් වීමට. ඔබට නිදහස ඇති වෙයි.

පරීක්ෂාවට ලක්වන සෑම අවස්ථාවකම ඔබ දෙවියන් වහන්සේගේ දරුවෙක් වන බවත්, උන්වහන්සේ ඔබව ආරක්ෂා කිරීමට පොරොන්දු වී සිටින බවත් යක්ෂයාට මතක් කරන්න. ඔබේ මනස වෙනස් කළ හැක්කේ දේව වචනය අධ්‍යයනය කර මෙනෙහි කිරීමෙනුයි. වැරදි සහ නිවැරදි සිතුවිලි අතර වෙනස ඉගෙනගත හැකි මාවත එයයි.

දිළිඳුව සිටින සමහර අය හිතයි තම ජීවිතය පුරාම තමන් දිළිඳුව සිටියි කියා. ඒ දේ සැබෑ දෙයක් නොවන බව දේව වචනයෙන් සොයාගත හැකියි. දෙවියන්වහන්සේගේ උපකාරය ඇතුව උන්වහන්සේගේ ප්‍රතිපත්ති ඔබේ ජීවිතයට ආදාල කර ගැනීමෙන් ඔබේ දිළිඳුකමේ චක්‍රය කඩාදමන්නත් ඔබට අවශ්‍ය දෑ පමණටත් වඩා ලබාගන්නත් ඔබට පුලුවන් වෙයි. එලෙසම ඔබේ ජීවිතය ආරක්ෂා වී, ඔබ සවල වී, නිරෝගීව සිටියි.

## සිතීමට නව මඟක්

ඔබ දෙවියන්වහන්සේ තුල වර්ධනය වන විට එතුමාට කීකරුව සිටින විට ප්‍රඥාවන්තව කටයුතු කිරීමට අවශ්‍ය බලය දෙවිදුන් විසින් ලබාදෙයි. දෙවියන්වහන්සේ ඔබේ අවශ්‍යතා සපුරන බැවින් ඔබ භයෙන් ජීවත් විය යුතු නැත. ඔබට රැකියාවක් අවශ්‍යනම් රැකියාවක් ඉල්ලා යාච්ඤා කළවිට දෙවියන්වහන්සේ රැකියාවක් සොයාගන්න ඔබට උපකාර කරයි. ඔබට කරුණාව ලබා දී ඔබ අත තබන සියලුදේම සඵලවත් කරයි.

යේසුස්වහන්සේගේ කැමැත්ත වනුයේ ඔබ යහපත් ජීවිතයක් ඇතුව සිටිනු දැකීමයි. ඔබට සැනසීම දෙන පිණිස පූජා කළා වූ තම ජීවිතය ප්‍රීතියෙන් භුක්ති විඳිනු දැකීම දේව කැමැත්තයි.

දැන ගැනීම, තේරුම් ගැනීම ආත්ම විමසීම නිවැරදිව අවබෝධ කරගත යුතුයි. "දැනගැනීම" නොමැතිකම නිසා ජනතාව විනාශයට පත්වන බැවින් එය ලබාගැනීමට හඩ නැඟිය යුතුයි.

දෙවියන්වහන්සේගේ මාර්ග තුල ඇවිදින පිණිස ඔබ තුල තිබෙන ප්‍රඥාව නැගී සිට ඔබේ මනස ආලෝකමත් කරන මෙන් දෙවිදුන්ගෙන් ඉල්ලා සිටිය යුතුයි.

"ප්‍රඥාව රතු කැට වලට වඩා හොඳය. ආශා විය හැකි සියලු දේවල්ද ඊට සමාන නොවේ." (හිතෝපදේශ 8:11)

වැඩියෙන්ම අලෙවි වූ මගේ පොත වන්නේ "මනස නම් යුද පිටිය" යන්නයි. ඔබත් හැකි ඉක්මනින් එය කියවන්න. ඔබේ සිතුවිලි අලුත් කිරීම සටනක් ලෙස කෙටි කාලයකට ඔබට දැනෙන බව මතක තබාගත යුතුයි. නමුත්, අත් නොහරින්න. ඕනෑකමින් දෙවියන්වහන්සේ සොයන්නන් හට විපාක ලැබෙන බව මතක තබාගන්න.

## පරිච්ඡේදය 6

# කථා කිරීමට නව මගක්

වචනයන් යනු බලය ක්‍රියාත්මක කරන එක් අංගයකි. එය මැවීමක් හෝ විනාශ කිරීමේ බලයක් උසුලාගෙන යයි. පටන් ගැන්මේදී දෙවියන්වහන්සේ වචන වලින් ලෝකය මැවූ සේක. අපිත් උන්වහන්සේගේ ආදර්ශය අනුගමනය කළ යුතුයි.

"මනුෂ්‍යයෙකුගේ බඩ තමාගේ මුඛයේ ඵලයෙන් පිරෙයි. තමාගේ තොල්වල අස්වැන්නෙන් ඔහු සෑහීමට පැමිණෙයි. මරණයත් ජීවිතයත් දිවේ වසඟයෙහි ඇත්තාහ. ඊට ප්‍රියවන්නෝ එහි ඵල භුක්ති විඳින්නෝය. (හිතෝපදේශ 18:20-21)"

මෙම බයිබල් පාඨය ප්‍රවේශමෙන් අධ්‍යයන කරන විට, සරලව පෙනී යන්නේ "වචනවලට ප්‍රතිඵල තිබෙන බවයි" සමහර වචන යහපත ගෙනෙන අතර සමහර වචන නපුර ගෙනෙයි. අපි කථා කිරීමට කට අරින විට අපේ වචන වලට බලය තිබෙන බව මතක තබාගෙන කථා කල යුතුයි. සිතුවිලි වචන බවට පරිවර්ථනය වේ. සාතාන් විසින් අපේ මනසට අසුභවාදී සිතුවිලි යොමු කිරීමට හේතු වන්නේ එයයි. ඒ සිතුවිලි නිසා අපි අසුභ දේවල් කථා කරමින් අපේ ජීවිත තුල අපවිත්‍ර දේ කිරීමට සාතාන්ට දොරක් විවෘත කරයි කියා ඔහු දනියි.

# කථා කිරීමට නව මඟක්

"තමාගේ මුඛයත් දිවත් රැකවල් කර ගන්නා, තමාගේ ප්‍රාණය විපත්ති වලින් රැකගන්නේය" (හිතෝපදේශ 21:23)

ලෝකය තුල තිබෙන ලොකුම පරීක්ෂාව වන්නේ දකින සහ දැනෙන කාරණාවන් පිළිබඳව කථා කිරීමයි. නමුත් දේව කැමැත්ත වන්නේ අපට ලබාගත හැකි දේවල් පිළිබඳව දෙවියන්වහන්සේගේ වචනය පවසන කාරණා ගැන කථා කිරීමයි. ඔබේ ජීවිතයේ සිදුවන දේවල් නොසකලා හැරිය යුතුයි කියා මා පවසන්නේ නැත. නමුත් ඒවා ඔබට පරාජය කළ හැකිය. ඔබේ ගැටළු පිළිබඳව ඔබ කථා කරන අන්දම ඒ සම්බන්ධව විශාල බලපෑමක් ඇති කරයි.

දින එකොළහකින් යාමට හැකි ගමනක් යාමට ඉශ්‍රායෙල්වරු අවුරුදු 40 ක් ගත කළා. වැඩකට නැතිව ඔවුන් එකම කන්දක් වටේ නැවත නැවත ගමන් කළා. ඔවුන්ට බොහෝ ගැටළු තිබුණු අතර ඒවායින් ලොකුම දේ වූයේ "පැමිණිලි" කිරීමයි. තමන්ට අවශ්‍ය දේ කරගැනීමට නොහැකි වූ හැමවිටම ඔවුන් කුරු කුරු ගාමින් පැමිණිලි කළා. වනාන්තරයේ සිටින විටත්, කඳු මුදුනේ සිටින විටත් දේව කැමැත්ත වන්නේ, අපි දෙවිදුන්ට ස්තූති ප්‍රශංසා කරනු දැකීමයි. කරදර වලදී උගුලකට අසුවී සිටින ලෙස කොපමණ කාලයක් ඒතුල සිටිනවාද කියා තීරණය කරනුයේ අපි ඒ අවස්ථාවේ "කියන" දේවල්ය. මෙය අමුතු කාරණයක් ලෙස හැඟුනත් ඔබේ වචනවලට බලයක් තිබෙනවා.

නැති දේ ඇති දේ ලෙස සඳහන් කරන්නා වූ දෙවිකෙනෙකුට අපි සේවය කරන බව රෝම 4:17 හි සඳහන් වේ. දෙවියන්වහන්සේගෙන් ඉෂ්ඨ විය යුතු දේ උන්වහන්සේ විසින් කළ යුතු දේ උන්වහන්සේ දන්න සේක. ඒ නිසා ඒ දේ දැනටමත් සිදු වී හමාර වූ ලෙස දෙවිදුන් ඒ ගැන කථා කරන සේක. මේ දේ ඔබ ඇදහිල්ලේ ඇස්වලින් දැකිය යුතුයි. ස්වභාවිකව දැකිය

නොහැකි දේ ඇදහිල්ලෙන් දකිය හැකියි. ඇදහිල්ල විසින් දෙවියන්වහන්සේගේ පොරොන්දු අරගෙන ඒවා සත්‍ය ලෙස ක්‍රියාත්මක කරයි.

අපට ගැටළුවක් තිබෙනවා නම්, දෙවිදුන් අපව එයින් මුදවයි කියා විශ්වාස කරනවා නම්, එය සිදුවනතෙක් බලා නොසිට දැන්ම අපට සතුටුවිය හැකියි. දෙවියන්වහන්සේ අප වෙනුවෙන් වැඩ කරමින් සිටින බව අපේ අභ්‍යන්තරය දැනගත යුතුයි. එය සිදුවන්නේ "ඇදහිල්ල" තුළිනි.

අනාගතවක්තෘ එසකියෙල් විසින් අත්විඳි හාස්කමක් ඇත. එක් අවස්ථාවක ඔහු අවට බැලූ විට මැරුණු පිරිසකගේ ඇටකට තිබෙනවා දුටුවා. ඒ ඇට කටු නැවත ප්‍රාණීන් කළ හැකිද කියා දෙවියන්වහන්සේ එසකියෙල්ගෙන් ඇසූවිට "එය දන්නේ ඔබයි" කියා ඔහු පැවසුවා. එවිට දෙවියන්වහන්සේ ඔහුට කථා කොට මේ ඇට වලට කථා කර "දෙවියන්වහන්සේගේ හඬ අසන්න. නුඹලා නැවත ජීවත් වන පිණිස නුඹලා තුළට ආත්මය පමුණුවමි" කියා පවසන්න කියා පැවසීය. දෙවිදුන් අණ කළ ලෙස ඔහු පැවසූ විට ඒ ඇටකටු මතට මාංශ පැමිණ ඔවුන් බලවත් හමුදාවක් බවට පත්විය. (එසකියෙල් 37)

## දෙවියන්වහන්සේගේ වචනය ශබ්ද නගා කථා කිරීම

දෙවියන්වහන්සේගේ වචනය ශබ්ද නගා කියවන ලෙස සෑම මනුෂ්‍යයෙකුටම මම පවසනවා. දෙවියන්වහන්සේ මට උගන්වා තිබෙන කාරණා අතර එය ඉතා වැදගත් වෙනවා. මගේ මනස අලුත් කිරීමටත්, මගේ ජීවිතය සෑම තැනකටම හරවන්නත් එය මට උපකාර වූ බව පැවසිය යුතුයි.

දෙවියන්වහන්සේගේ වචනය ආත්මික කඩුවකි. සාතාන්ට

එරෙහිව පාවිච්චි කළ හැකි ලොකුම ආයුධය එයයි. දේව වචනය ඉදිරියේ ඔහු භයෙන් වෙවුලනවා. යේසුස්වහන්සේව යක්ෂයා විසින් පරීක්ෂා කල බව ලූක් 4 තුල අපිට දැකිය හැක. යේසුස් වහන්සේ නොකා දිගු කාලයක් වනාන්තරයේ සිටි සේක. සාතාන් උන්වහන්සේගේ මනසට සිතුවිලි දමමින් උන්වහන්සේට බොරු දේවල් පැවසීය. ඒ හැම අවස්ථාවකම "මෙසේ ලියා තිබේ" යනුවෙන් පවසා යේසුස් වහන්සේ ප්‍රතිචාර දැක්වීය.

උන්වහන්සේ ශුද්ධ ලියවිලි පද ශබ්ද නගා කියවමින් බොරුවට එරෙහි විය. අපිත් උන්වහන්සේව අනුගමනය කරනවිට අපිටත් ජය මාර්ගය ඔස්සේ යා හැක.

ඔබ "පවසන දේවල්" ගැන සැලකිලිමත්වීමට ඔබ කැමතිද? එසේ නම්, අන් සියලු දෙනාම මෙන්, ඔබේ ජීවිතය තුල සිදු නොවිය යුතු කාරණා ගැන ඔබ බොහෝ ලෙස කථා කරන බව සොයා ගැනීමට ඔබට හැකිවෙයි.

අපි කථා කරන දේවල් තුලින් අපේ සමාදානයේ සහ ප්‍රීතියේ මට්ටම වැඩි කරන්න හෝ අඩු කරන්න හැකි බව මම විශ්වාස කරනවා. මා පවසන දේ නිවැරදි නම් දුක්වෙනවාට වඩා සතුටු වෙන දෙයක් ඔබ පවසන්නේ නැත්තේ ඇයි? ඔබේ අලුත් ජීවිතයේ කොටසක් වන්නේ, ඇදහිල්ලෙන් කථා කිරීමයි.

ඔබට මෙලෙස පැවසිය හැකියි;

දෙවියන්වහන්සේ මට ප්‍රේම කරන නිසා උන්වහන්සේ විසින් මගේ ජීවිතය වෙනුවෙන් යහපත් සැලැස්මක් තබා තිබෙනවා.

මම යන සෑම තැනකම මට කරුණාව තිබෙනවා.

මම අත තබන සියල්ලම සඵල වී සාර්ථක වෙනවා.

## ජීවිතයට නව මඟක්

දෙවියන්වහන්සේ විසින් මා වෙනුවෙන් නිවැරදි දොරවල් විවෘත කරමින් වැරදි දොරවල් වසා දමනවා.

මම ප්‍රඥාව තුල ඇවිදිනවා.

මම සමාදානයෙන් පිරී සිටිනවා.

මම ප්‍රීතියෙන් සිටිනවා.

මම ප්‍රේමයෙන් පිරී සිටිනවා.

අද මට යහපතක් සිදුවෙන්න යනවා.

මගේ හැම දරුවෙක්ම දෙවිදුන්ට ප්‍රේම කරමින් සේවය කරනවා.

දිනපතාම මගේ විවාහ ජීවිතය සාර්ථකව ගෙවෙනවා.

මම යන සෑම තැනදීම මම ආශිර්වාදයක් ලෙස සිටිනවා.

මෙලෙස බොහෝ දේ පැවසිය හැකියි. ඔබ පවසන දේ දෙවියන්වහන්සේ පවසන දේ ලෙස සහතික කරනවා. දෙවියන්වහන්සේ සමඟ එකඟ වූ පසු ඔබට අලුත් ලෝකයක් විවෘත වෙයි. ඒ තුලින් දේව සැලැස්ම ක්‍රියාත්මක වෙයි. එය නවත්වන පිණිස යක්ෂාට කිසිවක් කළ නොහැකියි.

පරිච්ඡේදය 7

# ඔබ දෙස බැලීමට නව මාර්ගයක

ඔබ විසින් ඔබව දකින්නේ කෙසේද? ඔබේ ස්වරූපය ඔබේ පසුම්බියේ තිබෙන ඡායාරූපය වගෙයි. වසර ගණනාවක සිට දේව සේවයේ නිරත වන මා සොයාගෙන තිබෙන්නේ මනුෂ්‍යයන්ගේ වැඩිදෙනෙක් "තමන්ට" කැමති නැති බවයි.

මම මගේ ජීවිතය සමඟ නරක සම්බන්ධතාවයක් ඇතුව සිටි බැවින් එය මගේ ජීවිතය තුල හැමදේම විෂ බවට පත් කළා. දෙවියන්වහන්සේ ඔබට ප්‍රේම කරනවා. ඒනිසා "ඔබත් ඔබට" ප්‍රේම කළ යුතුයි. ආත්මාර්ථකාමී ලෙස නොව යහපත් ලෙස එය කල යුතුයි.

ඔබ ළඟ නොමැති දෙයක් ඔබට වෙන කෙනෙකුට දිය නොහැකිය. දෙවියන්වහන්සේ ඔබට ප්‍රේම කරනවා. ඒ ප්‍රේමය පළමුව අපව සුව කර ඊළඟට එය අප තුලින් අන් අය දෙසට ගලා යනවා දැකීමටයි දෙවිදුන් කැමති වන්නෙ.

පළමුව ඔබටම ප්‍රේම නොකර දෙවියන්වහන්සේ ඔබට පිරිනමා තිබෙන ඒ ප්‍රේමය පිළිගැනීම ප්‍රතික්ෂේප කළහොත් කවදාවත් ඔබට අන් අයට ප්‍රේම කළ නොහැකියි.

ඔබ ඔබ ගැන තිබෙන අදහස පදනම් කර තිබෙන්නේ ඔබේ

ක්‍රියා කිරීම් මතද? බොහෝ දෙනෙක් එසේයි. එය වැරදි දෙයකි. මන්ද අපේ ක්‍රියා කිරීම් දිනපතා යහපත් දේවල්ම වෙන්නේ නැත. අප අසම්පූර්ණ මනුෂ්‍යයන් නිසා අපි තුලින් වැරදි සිදුවෙයි. නිවැරදි ලෙස ක්‍රියා කිරීමට ඕනෑකමක් තිබුණත් අපි හැමවිටම පටලැවිලි ඇති කර ගනී. අපට යේසුස්වහන්සේව අවශ්‍ය වන්නේ ඒ නිසායි. අපේ දුර්වලතා තුල උන්වහන්සේ තමාගේ ශක්තිය පෙන්වන සේක.

දෙවියන්වහන්සේට ඔබ පුදුම කෙනෙක් නොවෙයි. උන්වහන්සේ සමඟ සම්බන්ධකමක් තුලට ඔබ එතුමාට ආරාධනා කළ විට ඔබ කුමන ආකාරයේ කෙනෙක්ද කියා උන්වහන්සේ දැන සිටියා. අප විසින් ඉදිරියේදී කරන්න යන වැරදි පවා උන්වහන්සේ දන්නවා.

කෙසේ වෙතත් උන්වහන්සේ අපට ප්‍රේම කරනවා. ඔබ ඔබ ගැන තදින් නොසිතා දිනපතා දෙවියන්වහන්සේගේ දයාව ලබන්න ඉගෙනගත යුතුයි. දිනපතා දේව මහිමය උදෙසා ඔබට හැකි උපරිම ප්‍රමාණයට යහපතම කරන්න. ඔබ දෙවියන්වහන්සේට ප්‍රේම කරන බැවින් හැකි තරම් යහපත කරන්න. එසේ කළ යුත්තේ උන්වහන්සේ ඔබට ප්‍රේම කරන පිණිස නොවෙයි. උන්වහන්සේ දැනටමත් බොහෝ ලෙස ඔබට ප්‍රේම කරනවා. ඔබ වෙනුවෙන් තිබෙන උන්වහන්සේගේ ප්‍රේමය සම්පූර්ණයි. හැමදිනම අවසානයේ ඔබේ පව් වලට සහ වැරදිවලට සමාව දෙන ලෙස දෙවිඳුන්ගෙන් ඉල්ලන්න. රාත්‍රීයේදී හොඳට නිදාගෙන ඊළඟ දවස යහපත්ව ආරම්භ කරන්න.

සාතාන් ඔබට විරුද්ධයි. නුමුත් දෙවියන්වහන්සේ ඔබට පක්ෂයි. ඔබත් දෙවියන්වහන්සේට පක්ෂ වෙන්න. මන්ද දෙදෙනෙක් එකඟ වන විට ඔවුන් බලවත් වෙනවා. ඔබ දෙවියන්වහන්සේගේ ඇස් ඉදිරියේ අනර්ඝයි. දෙවිඳුන්ට ප්‍රයෝජනවත් වන බොහෝ

තලෙන්ත ඔබට තිබෙනවා. ඔබට කොපමණ වැරදුනාද කියාත් තව කොපමණ යා යුතුද කියාත් පමණක් නොව ඔබ කොපමණ දුරක් පැමිණියාද කියාත් බලන්න. ඔබ දැන් යේසුසවහන්සේගේ ඇදහිලිවන්තයෙක්. මේක ජීවිතය තුල පුදුම වූ සියලු දෙයකම පටන් ගැන්මයි.

## ධර්මිෂ්ඨකම තේරුම් ගැනීම

ධර්මිෂ්ඨකම පැමිණෙන්නේ අපගේ ක්‍රියාවලින් නොව ඇදහිල්ල තුලිනි. එය දෙවියන්වහන්සේගේ දීමනාවකි. යේසුස්වහන්සේව ඔබේ ගැලවුම්කාරයා ලෙස පිළිගන්න අවස්ථාවේදී එය දෙනු ලබයි.

මේ කාරණය ගැන ලියවුනු බයිබල් පාඨ තිබෙනවා. ඔබේ ධෛර්‍යය පිණිස මම ඒවා ඉදිරිපත් කරන්නම්.

"අප උන්වහන්සේගේ ධර්මිෂ්ඨකම වන පිණිස පාපයක් නොදන්නා වූ උන්වහන්සේ අප වෙනුවට පාපය වෙන්න දෙවියන්වහන්සේ සැලැස්වූ සේක." (2 කොරින්ති 5:21)

පුදුමයි, කොපමණ බලවත් පදයක්ද? යේසුස්වහන්සේ පාපයක් නැතුව සිටියා. නමුත් අප දෙවිපියාණන් සමඟ සම්බන්ධතාවයක් ඇතිකරගන්නා පිණිස උන්වහන්සේ අපට ප්‍රේම කරන නිසා අපේ පව් උසුලා ගත්තා. අපි යේසුස්වහන්සේව ගැළවුම්කාරයා ලෙස පිළිගෙන තිබෙන බැවින් දෙවියන්වහන්සේ අප දෙස බලන්නේ පිළිගත හැකි වූ යහපත් තත්වයක සිටින අය දෙස බලන ආකාරයටයි. මා එය නැවත පවසන්නම්.

දවියන්වහන්සේ අපට අකමැතිව අප ගැන තරහෙන් ඉන්නවා කියා භය නොවී "ක්‍රිස්තුස්වහන්සේ" තුල සිටගෙන, උන්වහන්සේ අපව පිළිගෙන තිබෙන බව දැනගත යුතුයි.

## ජීවිතයට නව මඟක්

"කුමක් හෙයින්ද ව්‍යවස්ථාවේ ක්‍රියාවලින් කිසිම මනුෂ්‍යයෙක් දෙවියන්වහන්සේ ඉදිරියෙහි ධර්මිෂ්ඨ කරනු නොලබන්නේය. මන්ද ව්‍යවස්ථාව කරණකොටගෙන පාපය දැනගැනීම වේ. (රෝම 3:20)

"යේසුස්ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි ඇදහිල්ල කරණකොටගෙන, අදහන්නා වූ සියල්ලන්ට ලැබෙන ධර්මිෂ්ඨකමය. ප්‍රභේදයකුත් නැත. (රෝම 3:22)

"යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි ඇදහිල්ල කරණකොටගෙන මිස ව්‍යවස්ථාවේ ක්‍රියා කරණකොටගෙන මනුෂ්‍යයෙක් ධර්මිෂ්ඨ කරනු නොලබන බව දැන, ව්‍යවස්ථාවේ ක්‍රියාවලින් නොව ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි ඇදහිල්ල කරණකොටගෙන ධර්මිෂ්ඨ කරනු ලබන පිණිස, ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි අදහා ගනිමුව. මක්නිසාද ව්‍යවස්ථාවේ ක්‍රියාවලින් කවර මනුෂ්‍යයෙක්වත් ධර්මිෂ්ඨ කරනු නොලබයි. (ගලාති 2:16)"

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුල ඔබේ ඇදහිල්ල තුලින් දෙවිදුන් ඉදිරියේ නිවැරදිව සිටින බව දැකීම ඔබේ ආත්මික වර්ධනය සඳහා වැදගත් වේ. එය දෙවියන්වහන්සේගේ දීමනාවකි. අපි ගැන නිතරම අයහපත් ලෙස සිතමින් දෙවිදුන් අප ගැන තරහෙන් සිටිනවාද කියා කල්පනා කරනවා නම් දෙවිදුන් සමඟ සිටීමට අවශ්‍යවන බලය අපට අහිමි වී යයි.

යේසුස්වහන්සේ තුල ඇදහිලිවන්තයින් ලෙස යක්ෂයා කෙරෙහි අප හට ආධිපත්‍යයක් ඇත. නමුත්, දොස් තැබීමෙන් වරදට පත් කිරීමෙන් නොව ධර්මිෂ්ඨකමින් සිටිය යුතුය. ලය වැස්මක් ලෙස ධර්මිෂ්ඨකම පැළැඳිය යුතු බව එපීස 6 හි පවසයි. ලයවැස්ම සොල්දාදුවාගේ හදවත ආරක්ෂා කරනවා.

ඔබ ගැන මොනවද සිතන්නේ? ඔබ දෙවියන්වහන්සේ සමඟ

යහපත්ව සිටින බව ඔබට විශ්වාස කළ හැකිද? කළ වැරදි ගැන නොබලා, යේසුස්වහන්සේ විසින් ඔබට කල දෙය ගැන ඇස් යොමු කළොත්, ඔබට එසේ කිරීමට පුලුවන් වෙයි. ඔබ අතින් වැරදි සිදුවුවහොත් ඉක්මනට පශ්චත්තාප වී දෙවිදුන්ගේ සමාව ගන්න. ධර්මිෂ්ඨකම තුල සිටිය හැකි එකම මාර්ගය එයයි. ඇදහිල්ල තුලින් ධර්මිෂ්ඨව සිටින්න.

යේසුස්වහන්සේගේ ඇදහිලිවන්තයෙක් ලෙස ඔබට ලැබෙන අලුත් ජීවිතයේ කොටසක් වන්නේ මේ පුදුම ආකල්පයයි.

## ප්‍රීතියෙන් ජීවත් වන්න

ඔබ දන් ප්‍රීතියෙන් ජීවත් විය යුතුයි. එලෙස සිටීම දෙවියන්වහන්සේගේ ආශාවයි. අනිත් අය ඔබ ගැන කියන හෝ කියා තිබෙන කාරණා මත ඔබේ වටිනාකම තක්සේරු නොකරන්න. මනුෂ්‍යයන් ඔබට සැලකූ ආකාරය හෝ ඔබේ ජීවිතය තුල සිදු වූ දේවල් මත එය තක්සේරු නොකරන්න. ඔබ බොහෝ වටිනා බව සිතූ දෙවියන්වහන්සේ ඔබ වෙනුවෙන් මරණයට පත්වීමට තම පුත්‍රයාව එවූ සේක. ඒ කාරණය නම් ප්‍රීතියට හේතුවක් වෙයි.

අපේ ජීවිතය සතුටින් භුක්ති විඳිය යුතු බව බයිබලය අපට උගන්වයි. ඔබ ඔබේ ජීවිතය සතුටින් ගෙවිය යුතුයි. තත්පරයකට වත් ඔබෙන් ඉවත් වී ජීවත් වන්න ඔබට නොහැකියි. ඔබේ ජීවිතය සතුටින් ගත නොකලොත් ඔබ ප්‍රයෝජනයක් නැති පුද්ගලයෙක් ලෙස ජීවිතය ගත කරයි.

මම වගේම ඔබත් වෙනස් ආකාරයේ පුද්ගලයෙක් වෙන්න ඇති . එලෙස වුවාට කමක් නැත. ඇත්තටම එය දෙවියන්වහන්සේ ඕනැකමින්ම කල දෙයකි. උන්වහන්සේ අපි සැමදෙනාවම වෙනස්

ලෙස මවා තිබේ. උන්වහන්සේ විවිධත්වයට කැමතියි. ඔබ අමුතු කෙනෙක් නොවෙයි. ඔබ "සුවිශේෂී" කෙනෙකි. ඒ නිසා ඔබට වටිනාකමක් තිබේ.

ඔබව අන් අය සමඟ සංසන්දනය කරමින්, ඔවුන් සමඟ තරඟ කරමින් ජීවිතය ගත නොකරන්න. (2 කොරින්ති 10:12) ඔබ ඔබේ ස්වභාවය අනුව ප්‍රීතියෙන් ජීවත් වන්න. එවිට ශුද්ධාත්මයාණන් ඔබේ ජීවිතය තුල කාර්යය බහුල වෙයි. යහපත් ආරංචිය නම් මේ දේවල් මෙලෙස සිදුවුවත් ඔබේ ජීවිතය ප්‍රීතියෙන් භුක්ති විඳීමටද ඔබට නිදහසක් තිබෙයි.

පරිච්ඡේදය 8

# භය වෙනුවට ඇදහිල්ල ඇතුව සිටින්න

භය යනු කුමක්ද කියා අපි සැවොම දනී. අපට පීඩා කරමින් අපේ ප්‍රගතිය අවහිර කර දැමීමට, අපව දුර්වල කර අප විසින් නිර්භීතව මුහුණ දිය යුතු දේවල් වලදී භයෙන් පැන යන්න මේ භයට පුලුවන.

භය පැමිණෙන්නේ දෙවියන්වහන්සේගෙන් නොවෙයි. දෙවිදුන් අපට දී තිබෙන යහපත් ජීවිතයට බාධා කරන, ආයුධයද එයයි. (2 තිමෝති 1:17) දෙවියන්වහන්සේ කැමති වන්නේ අපි ඇදහිල්ලෙන් ජීවත් වනවා දැකීමටයි. ඇදහිල්ලේදී යහපත කෙරෙහි බලා සිටිය යුතුයි. අපට දැකිය නොහැකි කාරණාවල්වල සහතිකය ඇදහිල්ලයි.

ඇදහිල්ල ක්‍රියාත්මක වන්නේ ආත්මික ගමනක් තුලයි. ඔබට පෙනෙන දකින කාරණා ගැන පමණක් විශ්වාස කරීමට ඔබ පුරුදු වී ඇති නමුත් දෙවියන්වහන්සේගේ දරුවෙක් නොපෙනෙන කාලයක් ගැන විශ්වාස කරමින් නිදහසේ ජීවත් විය යුතුයි. දෙවියන්වහන්සේ ආත්මයක් නිසා උන්වහන්සේව අපට නොපෙනෙයි. නමුත් අපි එතුමා කෙරෙහි ස්ථිරව විශ්වාස කල යුතුයි. අපි දේව දූතයන්ව නොදක්කත් ඔවුන් අප වටේ සිටිමින් නිතරම අපව ආරක්‍ෂා කරන බව බයිබලය පවසයි.

දෙවියන්වහන්සේ කෙරෙහිත් උන්වහන්සේගේ වචනය කෙරෙහිත් අපේ ඇදහිල්ල දියත් කරන විට ආත්මික ගමන තුලදී අපට ලැබෙන තවම නොලැබුණු දේවල් ගැන සතුටින් බලා සිටීමට හැකියාව ලැබෙයි.

අපේ අවධානය නොයෙක් දේ කෙරහි යොමු කිරීමටත්, අනාගතය ගැන භය ඇති කිරීමටත් සාතාන් කැමති වෙනවා. දෙවියන්වහන්සේ කැමති වන්නේ යක්ෂයාගේ බාධක ඉවත දමා උන්වහන්සේ කෙරෙහි විශ්වාස තබනවාටයි.

කිසිවෙකුගේ උපකාරයක් නොමැතිව සිටි මනුෂ්‍යයන් ගැන බයිබලයෙහි සඳහන් වේ. ඔවුන්ගේ හදවත භයෙන් පිරී තිබුණු බැවින් ඔවුන් එලෙස සිටියා. නමුත් ඔවුන් තමන්ගේ විශ්වාසය දෙවියන්වහන්සේ කෙරෙහි යොමු කිරීමට තීරණය කළ පසු මහිමය සහ මිදීම අත්දුටුවා. ඔබත් භයෙන් ජීවත්වනවාද නැතිනම් ඇදහිල්ලෙන් ජීවත්වනවාද කියා ඔබම තීරණය කල යුතුයි. ඔබ කිතුණුවෙක් වුවත් ඇදහිල්ලෙන් ජීවත් වීමට තීරණය නොකලොත් ඉදිරියටත් ඔබට භයෙන් පීඩිතව ජීවත්වන්න සිදුවෙයි.

දැන් ඔබ ඇදහිල්ලෙන් යේසුස්වහන්සේ ඔබේ ගැළවුම්කරු ලෙස පිළිගෙන තිබෙනවා. ඊළඟ පියවර වන්නේ ඇදහිල්ලෙන් ජීවත්වීමට ඉගෙන ගැනීමයි.

“ධර්මිෂ්ඨයා ඇදහිල්ලෙන් ජීවත් වේ යැයි ලියා තිබෙන ලෙස, ඇදහීමෙන් පැමිණෙන දෙවියන්හන්සේගේ ධර්මිෂ්ඨකම ඇදහීම පිණිස එහි එළිදරව් වී තිබේ.” (රෝම 1:17)

අපි යේසුස් වහන්සේගේ මරණය සහ මළවුන්ගෙන් නැගිටීම තුලින් දෙවියන්වහන්සේගේ ප්‍රේමය තේරුම් ගන්නා විට ඇදහිල්ලෙන් ජීවත් වීමට පහසු බව අවබෝධ කරගත හැකියි. කිසිම දෙයක් ගැන නොසිතා දෙවිදුන් අපව ආරක්ෂා කරයි, අපට අවශ්‍ය දේ සපයයි කියා විශ්වාස කල යුතුයි.

# භය වෙනුවට ඇදහිල්ල ඇතුව සිටින්න

නිර්භීතකම යනු භය නැතුව සිටීම නොවෙයි. භය ඇතිවිටත් ධෛර්‍යමත්ව ක්‍රියා කිරීමයි. වරක් "භය වෙන්න එපා" කියා දෙවියන්වහන්සේ තම දාසයන්ට පැවසූ විට එතැනදී උන්වහන්සේ අදහස් කළේ භය නොවී ඉන්න කියා නොව භය දැනුනත් දෙවිඳුන්ට කීකරුව සිටින්න කියායි.

දෙවිඳුන් සමඟ අපේ තිබෙන සම්බන්ධතාවය කඩා දැමීමට භයේ ආත්මය ක්‍රියාත්මක කරන බව දෙවියන්වහන්සේ දැන සිටින සේක. දෙවියන්වහන්සේ අප සමඟ සිටින බව නිතරම දේව වචනය තුල පවසන්නේ එබැවිනි. එනිසා අපි භයෙන් වැටී යා යුතු නැත.

එලීනෝ රූස්වෙල්ට් මෙලෙස පවසනවා, "ඔබට භය ගෙන දෙන සෑම අත්දැකීමක්ම තුලින්ම ඔබට ශක්තිය, ධෛර්‍යය, නිර්භීතකම සහ ආත්ම විශ්වාසය ලැබෙනවා. එනිසා කළ නොහැකියි කියා සිතෙන දෙය ඔබ කළ යුතුයි.

"ශක්තිමත්ව ධෛර්‍යයමත්ව සිටින්න. භය නොවන්න. තැති නොගන්න. මක්නිසාද නුඹේ දෙවි වූ ස්වාමින්වහන්සේම නුඹ සමඟ යන සේක. උන්වහන්සේ නුඹෙන් අහක්ව යන්නෙවත් නුඹ අත්හරින්නේවත් නැත. (ද්විතිය කථාව 31:6)

දෙවියන්වහන්සේව සතුටු කරන්නේ ඇදහිල්ල පමණයි. අපි දෙවිඳුන්ගෙන් යමක් ලබාගන්නවා නම් ඒ ඇදහිල්ල තුලිනුයි. ඇදහිල්ල ගැන ඉගෙන ගන්නත් ඒ තුල ජීවත් වන්නත් ඉගෙන ගැනීම අලුත් ඇදහිලිවන්තයින්ට ඉතා වැදගත්ය. ඇදහිල්ල වර්ධනය කරගැනීම ව්‍යායාම කිරීම හා සමානයි. ඇදහිල්ල ක්‍රියාත්මක කළ යුත්තේ ක්‍රම ක්‍රමයෙන්ය. ඒ තුලින් ඇදහිල්ල ශක්තිමත් වේ.

## ජීවිතයට නව මඟක්

විශ්වාස කරන තැනැත්තාට බොහෝ දේ කළ හැකි බව මතෙව් 17:20 හි සඳහන් වේ. අපේ ජීවිතයේ තිබෙන කරදර නැමැති කඳු, කුඩා ඇදහිල්ලකින් ඉවත් කළ හැකියි. ඔබ ගැටළු විසඳා ගැනීමට උත්සහා කරමින් බොහෝ විට දුක් වී, බලාපොරොත්තු සුන් වී සිටින්න හැකියි. එසේනම් ඔබ දැන් සිටින්නේ අලුත් අත්දැකීමක් අභියසයි. ඔබට අවශ්‍ය දේ ගැන යාච්ඤා කර දෙවියන්වහන්සේට භාරදෙන්න ඔබට දැන් පුලුවන්. මනුෂ්‍යයාට කළ නොහැකි දේ දෙවිදුන්ට කළ හැකි බව එහිදී ඔබට සොයාගත හැකියි.

ඔබ විශ්වාස කරන ප්‍රමාණයට ඔබට ලැබෙයි. (මතෙව් 9:29) ඔබේ ජීවිතය තුල බොහෝ කාලයක් ඔබ භයෙන් ජීවත්වී ඇති නමුත් දැන් ඒ භය වෙනුවට ඇදහිල්ල හුවමාරු කරගැනීමට කාලය පැමිණ තිබේ.

මෙම අලුත් මාර්ගය ඉගෙන ගැනීමට කාලයක් අවශ්‍යයි. නමුත් අධෛර්‍යයමත් වී අත්හැර දමන්න එපා. අපි විසින් කළ යුතුයි කියා දෙවියන්වහන්සේ පැවසූ දේවල් කරනවිට සියලුදේම ක්‍රම ක්‍රමයෙන් වෙනස් වෙයි.

පරිච්ඡේදය 9

# භය වෙනුවට ඇදහිල්ල ඇතුව සිටින්න

"සොරා එන්නේ සොරකම් කරන්ටත්, මරන්ටත්, විනාශ කරන්ටත් පමණක්ය. මා ආවේ ඔවුනට ජීවනය ලැබෙන පිණිසත් එය අධික ලෙස ලැබෙන පිණිසත්ය." (යොහාන් 10:10)

යේසුස්වහන්සේ මැරුණේ ඔබ ප්‍රීතියෙන් ජීවිතය ගත කරනු පිණිසය. ඔබට අවශ්‍ය ලෙස සියලුදේම සඵල වී ඔබට කිසි අමාරුකමක් නැතිවෙයි කියා එයින් මා අදහස් කරන්නේ නැත. දෙවියන්වහන්සේ තුල ශුද්ධාත්ම බලයෙන් යුතුව ලෝකයේ ඉහළම තැනකට පැමිනීමට ඔබට හැකිවෙයි.

අපේ සැබෑ ජීවිතය වන්නේ දෙවියන්වහන්සේයි. උන්වහන්සේ තුල ජීවත්වෙමින් සිටින විට ජීවිතයේ සෑම දවසක්ම ප්‍රීතියෙන් භුක්ති විදින්න ඔබට පුලුවන් වෙයි. ඔබට සම්බන්ධ හැම කාරණයක් පිළිබඳවම දෙවියන්වහන්සේ සැලකිලිමත්ව සිටින සේක. ඔබ හා සම්බන්ධ සියලු කාරණා දෙවිදුන් සම්පූර්ණ කරන බව බයිබලය පවසයි.

ඔබව සම්පූර්ණයෙන් තම කැමැත්ත තුලට ගෙන ඒම සඳහා දෙවියන්වහන්සේ හැමවිටම ඔබේ ජීවිතය තුල ක්‍රියා කරමින් සිටියි. ඔබ වැරදි ලෙස දෙවියන්වහන්සේ කෙරෙහි බිය නොවන්න. අප තුල දෙවිදුන් කෙරෙහි භක්තිවන්ත භයක් තිබිය යුතුයි.

උන්වහන්සේට ගරු කරමින් එතුමා සර්වබලධාරි බවත්, උන්වහන්සේ පවසන දේවල් සිදුවන බව අප දනගත යුතු බව ඉන් අදහස් වේ. අපි අතින් වරදක් සිදුවන හැමවිටම දෙවියන්වහන්සේ අප ගැන තරහෙන් සිටින බව හෝ සම්පූර්ණ ලෙස ක්‍රියා කිරීමට අපට නොහැකිවන හැමවිට උන්වහන්සේ අපට දඬුවම් කරයි කියා කවදාවත් භය නොවිය යුතුයි. දෙවියන්වහන්සේ දයාවන්තයි. කෝප වීමට ප්‍රමාදයි. ඉවසිලිවන්තයි. අපේ ස්වභාවය දන්න උන්වහන්සේට අපේ අඩු පාඩු සහ දුර්වලතා තේරෙනවා.

ඔබ සහ අපි හැමෝම තුල වෙනස් කල යුතු බොහෝ කාරණා තිබෙනවා. දෙවියන්වහන්සේ ඒවා වෙනස් කරයි. යහපත් ආරංචිය නම්, උන්වහන්සේ එසේ කරන අතරෙදීත් ඔබට ඔබේ ජීවිතය ප්‍රීතිමත්ව ගත කරන්න පුලුවන් වීමයි.

ඔබට මේ දන් තිබෙන ජීවිතය තව බොහෝ කලකට පසු තිබෙන ජීවිතයට වඩා වෙනස් විය හැකියි. නමුත් ඔබ දන් වර්තමානයේ තිබෙන ජීවිතය ප්‍රීතියෙන් ගත කළ යුතුයි. ඒ තුල තිබෙන සුභවාදී, යහපත් කාරණා සැලකිල්ලට ගත යුතුයි. සියලු දේ තුලම තිබෙන යහපත දකින්නට ඉගෙන ගත යුතුයි.

ඔබේ පවුලේ අය හා මිතුරන් සමඟ ප්‍රීතියෙන් සිටිය යුතුයි. ඔවුන් හා වාද කරමින්, කරදර වෙමින් ඔවුන්ව වෙනස් කරන්න උත්සහා නොකරන්න. ඔවුන් වෙනුවෙන් යාච්ඤා කරමින් ඔවුන්ව වෙනස් කිරීමට දෙවියන්වහන්සේට ඉඩදෙන්න.

ඔබේ වැඩ, ඔබේ නිවසේ වැඩ කරමින් සාමාන්‍ය ජීවිතය ප්‍රීතියෙන් භුක්ති විදින්න. මෙය කළ හැක්කේ ඔබ දෙවියන්වහන්සේව විශ්වාස කරමින් යහපත් ආකල්ප ඇතුව සිටින්න තීරණය කළහොත් පමණි. ඔබ ඔබේ ජීවිතය, පවුල

සහ ලෝකය ගැන තිබෙන සෑම වැරදි දේවල් ගැන ඇස් යොමු නොකර දෙවියන්වහන්සේ කෙරෙහි පමණක් ඇස් යොමු කරන්න.

ඔබ වෙනුවෙන් යහපත් සැලැස්මක් සූදානම් කර තිබෙන දෙවියන්වහන්සේ දනටමත් එය ක්‍රියාත්මක කරන්නට පටන් ගෙන තිබේ. ඉදිරියේදී ලැබෙන්න තිබෙන යහපත් කාරණා දෙස බලා දන් පටන්ම ප්‍රීතියෙන් ගත කරන්න.

අතීතයේදී සිදු වූ වැරදි, කලකිරීම් ගැන සිතමින් නොසිටින්න. එලෙස සිතීම වැරදි දෙයක්. ඔබ එලෙස ඒ දේවල් සිතනතාක් කල් ඔබේ ජීවිතය ප්‍රීතියෙන් ගත කල නොහැකි වේ. යේසුස්වහන්සේ තුල තිබෙන මහත් වූ අලුත් අනාගතය ගැන නිතරම සිතන්න.

ඔබේ ජීවිතය තුල සිදුවන හැමදේම සතුටින් භුක්ති විඳින්න. වාහන තදබදයක් තුල සිටින්න වුවහොත් එයද සතුටින් භුක්ති විඳින්න. මම ඔබට ජීවත් වීමට අලුත් මාර්ගයක් උගන්වන බව මතක තබා ගන්න. එහි විශාලම දෙය වන්නේ ජීවිතය ගැන ඔබ දරන ආකල්පයයි.

අනාගතයේදී මා විසින් යන ස්ථානය ගැන සිතමින් වර්තමානය තුල සතුටින් ජීවත් වෙන්න මම අවසානයේදී ඉගෙන ගත් ලෙසම ඔබත් ඉගෙන ගනියි කියා මා විශ්වාස කරනවා. ඔබේ ජීවිතය තුල දෙවියන්වහන්සේ වෙනුවෙන් කළ යුතු බොහෝ දේ තිබෙනවා. ඒවා කරන අතර ඔබ කලකිරී ජීවත් විය යුතු නැහැ.

ළදරුවන් වැඩිහිටියන් ලෙස වර්ධනය වන කල කිතුණුවන්ද වර්ධනය විය යුතුයි. බොහෝ විට ඒ ක්‍රියාවලියට ලොකු කාලයක් ගත වෙනවා. නමුත් ඒ ගමන සතුටින් භුක්ති විඳිය යුතුයි.

# ජීවිතයට නව මඟක්

ඔබ සම්පූර්ණ මනුෂ්‍යයෙක්ව සිටියි කියා දෙවිඳුන් බලාපොරොත්තු වෙන්නේ නැහැ. පොළොවේ ජීවත් වන තුරු කවදාවත් සම්පූර්ණ ලෙස ජීවත් විය නොහැකි බව දෙවියන්වහන්සේ දන්නවා.

කෙසේ වෙතත් අපි සියලුදෙනාම ඉදිරියට යයි කියා උන්වහන්සේ අපේක්ෂා කරනවා. අපි සියලුදෙනාම දෙවියන්වහන්සේට සේවය කරනු පිණිස අවංකව උත්සහා කළ යුතුයි. අපේ අසාර්ථකකම්, අඩු පාඩු තේරුම් ගෙන, පව් වලට සමාව ඉල්ලා ඒවායින් ඉවත්වීමට කැමැත්තක් දක්විය යුතුයි. අපි ඒ දේ කළොත් දෙවියන්හන්සේ ඉතිරි කාරණා ඉෂ්ඨ කරයි.

උන්වහන්සේ ශුද්ධාත්මයාණන් සමඟ ක්‍රියා කරමින් අපට උගන්වමින්, වෙනස් කිරීම තුලින් අපව පාවිච්චි කරයි. ජීවත් වීම සඳහා ඔබ විසින් නව මාර්ගයකට පියවරක් ගෙන තිබෙනවා. ඔබ සතුටින් සිටින්න. ඔබට ලබාදීම උදෙසා යේසුස්වහන්සේ පූජා කළා වූ ජීවිතය ප්‍රීතියෙන් භුක්ති විඳින්න.

## මිදීමේ යාච්ඤාව

දෙවි පියාණෙනි, මම ඔබට ප්‍රේම කරනවා.

මගේ පව්වලට සමාව දෙන මෙන් විශ්වාසයෙන් ඔබ වෙත පැමිණෙනවා.

යේසුස්වහන්ස, මම ඔබව විශ්වාස කරනවා.

මා වෙනුවෙන් ඔබ කුරුසියේ මැරුණු බව, මා වෙනුවෙන් ඔබේ පවිත්‍ර රුධිරය වැගුරෙවු බව මා විශ්වාස කරනවා.

මට ලැබිය යුතු සියලු දඬුවම ඔබ වින්දා.

ඔබ මරණයට පත් වී වළලනු ලැබ, තුන්වෙනිදා මළවුන්ගෙන් නැගිට්ට බව මා විශ්වාස කරනවා.

ඔබ මරණය සහ සාතාන්ව පරාජය කර පාතාලයේ සහ මරණයේ යතුර ලබා ගත්තා. ඔබ මට ප්‍රේම කල නිසා මා වෙනුවෙන් මේ දේවල් කළ බව මා විශ්වාස කරනවා.

මට කිතුණුවෙක් විය යුතුයි.

මා විසින් උන්වහන්සේට සේවය කළ යුතුයි

ඔබ මට ලබාදීමට පොරොන්දු වී ඇති නව ජීවිතය ලබාගන්න මට ඉගෙනගන්න අවශ්‍යයි.

මම ඔබව දැන් පිළිගන්නවා.

යේසුනි, මම ඔබට මාව භාරදෙනවා.

ඔබ කැමති ලෙස මාව වෙනස් කරන්න.

ඔබ මාව මිදුව නිසා ස්තූතියි, යේසුනි.

## ජීවිතයට නව මඟක්

ඔබේ ශුද්ධාත්මයෙන් පුරවා මා හට සියලුදේම උගන්වන්න.

මට ගැළවීම තිබෙන බවත්, මම නැවත ඉපදුන බවත්, මරණයට පසු මා ස්වර්ගයට යන බවත් මා දැන් විශ්වාස කරනවා.

දෙවිපියාණෙනි, මම සතුටින් ජීවත් වෙමින් ඔබේ මහිමය උදෙසා වෙනවා.

# කතෘ පිළිබඳව

ලෝකයේ සිටින බයිබල් ගුරුවරුන් අතර ප්‍රමුඛ ස්ථානයක් ගන්නා ජොයිස් මේයර් සහෝදරිය විසින් දේව ආනුභාවයෙන් යුතුව පොත් හැත්තෑවකට වඩා රචනා කර ඇත.

තවද ඉගැන්වීම් ඇතුලත් කැසට්පට සහ සංයුක්ත තැටි දහස් ගණනාවක් නිකුත් කර ඇත.

ජොයිස් මේයර් සහෝදරියගේ "දිනපතා ජීවිතය ප්‍රීතියෙන් භුක්ති විඳීමේ" ගුවන් විදුලි සහ රූපවාහිනි වැඩසටහන් ලෝකයේ සෑම රටකම විකාශය වේ.

තවද, ඇය දේව වචනය පිළිබඳව සම්මේලන පවත්වමින් ලෝකය පුරා සංචාරය කරයි.

ජොයිස් සහ ඇගේ ස්වාමිපුරුෂයා වන ඩේව් හට දරුවන් හතර දෙනෙක් සිටිනවා. ඔවුන් පදිංචිව සිටින්නේ මිසූරි ජනපදයේ ශාන්ත ලුවිස් නගරයේයි.

# ගැළවීමේ යාච්ඤාව!

දෙවියන්වහන්සේ ඔබට ප්‍රේම කරනවා මෙන්ම ඔබ සමඟ පුද්ගලික සම්බන්ධතාවයක් ඇති කර ගැනීමට උන්වහන්සේට අවශ්‍යය. ඔබ යේසුස්වහන්සේව ඔබගේ ගැළවුම්කරුවාණන් ලෙස පිළිගෙන නොමැති නම්, ඔබට දැන්ම එය කළ හැකිය. මේ දැන්ම ඔබේ හදවත උන්වහන්සේට විවෘත කර මෙම යාච්ඤාව කරන්න.

''පියාණෙනි, මා ඔබට විරුද්ධව පව් කළ බව මම දනිමි. කරුණාකර මට සමාව දුන මැනව. මාව පවිත්‍ර කළ මැනව. ඔබේ පුත්‍ර වූ යේසුස්වහන්සේව විශ්වාස කිරීමට මම පොරොන්දු වෙමි. උන්වහන්සේ මා වෙනුවෙන් මරණයට පත් වූ බව මම පිළිගනිමි. - මාගේ පාපයේ බර උන්වහන්සේ උසුලා ගනිමින්, මා වෙනුවෙන් කුරුසියේ දිවි පිදූ සේක. උන්වහන්සේ මළවුන්ගෙන් උත්ථාන වූ බව මම අදහමි. මාගේ ජීවිතය යේසුස්වහන්සේට මේ මොහොතේම යටත් කරමි.

පියාණෙනි, ඔබවහන්සේ මට ත්‍යාගයක් ලෙස දී ඇති කමාව හා සදාකාලික ජීවනය නිසා ඔබට ස්තූතියි. ඔබවහන්සේ උදෙසා ජීවත්වීමට මට උපකාර කළ මැනව. යේසුස්වහන්සේගේ නාමයෙන්, ආමෙන්''

ඔබේ හදවතින්ම ඔබ යාච්ඤා කරන විට, යේසුස්වහන්සේ ඔබව බාරගෙන, ඔබව පවිත්‍ර කර, ආත්මික මරණය නම් වහල්භාවයෙන් ඔබව නිදහස් කරනු ඇත. ඔබ කාලය ගෙන පහත සඳහන් ශුද්ධ වූ බයිබලයේ පරිච්ඡේදයන් කියවා අධ්‍යයනය කර, ඔබගේ අලුත් ජීවිත ගමන තුළින් උන්වහන්සේ සමඟ ගමන් කරන විට දෙවියන්වහන්සේට ඔබට කතා කරන ලෙස ඉල්ලා සිටින්න.

| | |
|---|---|
| ශු.යොහන් 3:16 1 | කොරින්ති 15:3-4 |
| එපීස 1:14 | එපීස 2:8-9 |
| 1 යොහන් 1:9 | 1 යොහන් 4:14-15 |
| 1 යොහන් 5:1 | 1 යොහන් 5:12-13 |

දෙවියන්වහන්සේට යාච්ඤා කර, ක්‍රිස්තුස්වහන්සේ තුළ උද්යෝගීමත්ව, යහපත් පුද්ගලික සම්බන්ධතාවයක් වර්ධනය කර ගත හැකි, නිවැරදිව බයිබලය විශ්වාස කරන දේවස්ථානයක් සොයා ගැනීමට උදව් වන ලෙස ඉල්ලා සිටින්න. දෙවියන්වහන්සේ සෑමවිටම ඔබ සමඟ සිටින සේක. දෙවියන්වහන්සේ එක් දිනෙක, එක් මොහොතක, ඔබ උදෙසා උන්වහන්සේ සතුව ඇති සඵලවත් ජීවිතය තුළ ජීවත් විය යුත්තේ කෙසේද? කියා ඔබට මඟ පෙන්වන සේක.

# ඔබ සදාකාලික ජීවිතය ගත කිරීමට යන්නේ කොහේද?



අද දවසේ හෝ තව මාස කිහිපයක් ඉදිරියට සිදුවන දේ පිළිබඳව පමණක් අද බොහෝ අය උනන්දු වෙති. වැඩිම වුවොත් ඔවුන් කල්පනා කරනුයේ සේවයෙන් විශ්‍රාම ගිය පසු කුමක් සිදුවේද කියාය. නුමුත් මරණයෙන් මතු ජීවිතය කෙබඳු වේද? ඔබ ඒ සඳහා සූදානම්ද?

ඔබේ භෞමික ශරීරය යම් දිනෙක මිය යන මුත් ඔබේ ආත්මය සදාතනිකව ජීවත් වනු නියතය. ඔබේ ආත්මය ජීවත් වන්නට යන්නේ ස්වර්ගයේද, නිරයේද යන්න තීරණය වනුයේ ඔබ අද කරන තේරීම මතය. හොඳම අලෙවි වාර්තා තැබූ කෘති ගණනාවක කතුවරිය ජොයිස් මේයර්ගේ මේ පොත තුලින් ඔබට නිවැරදි තීරණය ගැනීම පහසු කරවන පිණිස ගැළවීම සඳහා දේව සැලැස්ම සැකෙවින් ගෙන හැර දක්වයි.

## ප්‍රේමයෙන් හා ඉවසිල්ලෙන් ඇය ඔබට උගන්වන කාරණය නම්

- යේසුස්වහන්සේගේ පුවත සහ උන්වහන්සේගේ වැදගත්කම.
- ඇදහිල්ල සිත තුල නොව හදවත තුල හටගන්නා අන්දම.
- යේසුස්වහන්සේව පිළිගැනීම සඳහා ඔබ විශ්වාස කළ යුත්තේ කුමක්ද?
- ඔබේ නව ජීවිතය තුල ආරම්භයක් ඇති කරගන්නේ කෙසේද?

තවත් කල් දමන්න එපා. ජීවිත් වීමට නව මඟක් සොයා දැනගැනීමට හොඳම වේලාව දැන්ය.

JOYCE MEYER MINISTRIES®

ජොයිස් මේයර් සේවය නො:
125, ශාන්ත ජෝසප් වීදිය,
ග්‍රෑන්ඩ්පාස්, කොළඹ - 14